# සද්ධර්මරත්නාවලිය සහ සාහිත්‍යාත්මක ධර්ම සන්නිවේදනය

විමල් හේවාමානගේ

Apart from Pali, Sanskrit, Chinese and Mongolian Buddhist Canons, Buddhism enriched with a number of literary works inscribed in many local languages; Sinhala, Tibetan, Thai, and Burmese etc. The *Saddharmaratnāvaliya*, composed in Sinhala in mediaeval period, contributed to stimulate the Buddha's teachings among Sinhalese. Though, in general, it is deliberated as translation based on the *Dhammapadaṭṭhakathā*, Commentary to the *Dhammapada* duty made by the author, Dhammasena Thera is beyond a translator and hence, scholars would prefer to appreciate his contribution as adaptation to the *Dhammapadaṭṭhakathā*. He expressed the stories with familiar similes and parables and passed the Buddha's message to Sinhalese with the taste of the literature. Stories presented throughout the text represent the Buddhist teachings prominently centred on ethics and its implication. Psychological expressions and behaviours of human beings depicted in his work are appreciable. Dhammasena Thera's contribution through promoting meritorious deeds and discouraging demerits is greatly supported to the Sinhalese society even today. This literary work brings the readership from delectation to wisdom through Buddhist communication.

## හැඳින්වීම

කාලිංගමාඝ ආක්‍රමණයෙන් විනාශ වී ගිය පොළොන්නරු යුගයෙන් පසු රට එක්සේසත් කිරීමේ ගෞරවය විජයබාහු රජතුමාට හිමි වේ. ඔහු ශ්‍රී ලංකාව එක්සේසත්

කොට ක්‍රි.ව. 1220 දී දඹදෙණි පව්ව මතුයෙහි රාජධානියක් ඉදිකර ගත්තේය. උගත් භික්ෂූන් වහන්සේලා සහ බුද්ධිමත් ජනයා දඹදෙණි ප්‍රදේශයට ගෙන්වා ගනිමින් රට සමෘද්ධිමත් කිරීමට රජතුමා ගත් ක්‍රියාමාර්ග ඉතිහාසයෙහි කැපී පෙනෙයි. මෙම පියවර ඉදිරියට ගෙන යමින් ඉතාමත් කෙටි කාලයකදී රට සංවර්ධනය කිරීමේ පුරෝගාමියා වූයේ දෙවනි පරාක්‍රමබාහු රජතුමා යි. විශේෂයෙන් භික්ෂූන් වහන්සේලා රැක ගැනීමේ කාර්යයට මූල්තැනක් දී කටයුතු කළ චකවානුවක් වූ බැවින් ශාසනික හා සාහිත්‍ය සංවර්ධනයක් ද ඇති වී තිබේ. සිංහල සාහිත්‍ය වංශයේ අද්විතීය ස්ථානයක් හිමිවන දඹදෙණිය සාහිත්‍ය යුගයේ ඇතිවූ සාහිත්‍ය ප්‍රබෝධයෙහි පූර්ණ ගෞරවය හිමිවිය යුත්තේ දෙවැනි පරාක්‍රමබාහු රජතුමාට ය. ඉන්දියාවෙන් පවා පොතපත හා උගතුන් ගෙන්වා ශාස්ත්‍රීය දියුණුවකට මග පෑදූ අතර මේ කෙටි කාලය තුළ බණ පොත් විශාල සංඛ්‍යාවක් ලියැවී තිබේ. පොළොන්නරු අග භාගයෙහි විනාශ වී ගිය පොත්පත් නැවත ලියවීමට කටයුතු කරන ලද අතර අභිනව කෘති ගණනාවක් ලිවීමට අනුබල දී තිබේ.

දඹදෙණි සාහිත්‍ය යුගය සිංහල ගද්‍යයෙහි උසස් ම යුගය සේ සැලකිය හැකි ය. විශේෂයෙන් බණකතා ඇසීමේ පොදු ජන රුචියට අනුකූලව අමාවතුර, බුත්සරණ, දහම්සරණ, සඟසරණ, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය ආදි බණකථා ග්‍රන්ථ රාශියක් බිහි වීම කැපී පෙනෙන ලක්ෂණයකි. දඹදෙණි යුගයෙහි රචනා ශෛලිය උපමා, රූපක යොදා ගත් දියුණු ගද්‍ය ශෛලියකි. විශුද්ධමාර්ග සන්නය ගද්‍යයෙහි විසිතුරු අවස්ථාවකි. පාලි හා සංස්කෘත භාෂා අධ්‍යයනය හා පරිශීලනය අතින් ද දඹදෙණි යුගය ඉදිරියෙන් සිටී. එදා සිට අද දක්වා ම උගතුන් අතර ජනප්‍රිය වී ඇත්තේ මෙම සංස්කෘත මිශ්‍ර වී සංවර්ධනය වූ සිංහලය යි. නමුත් හුදු සිංහලය ගද්‍යයට ද භාවිත කළ හැකි බව ගුරුළුගෝමීන් අමාවතුරින් ඔප්පු කොට තිබේ. මීට අමතරව සිදත්සඟරාව, යෝගාර්ණවය, ප්‍රයෝගරත්නාවලිය, කඳවුරුසිරිත, වැනි ග්‍රන්ථ ද යුගයේ අලංකරණය පිණිස හේතු විය. එසේ ම දඹදෙණි යුගයේ කෙරුණු දඹදෙණි කතිකාවත ද ශාස්ත්‍රීය අධ්‍යයනයක දී අමතක කළ නොහැකි ය. මෙය සාහිත්‍ය ග්‍රන්ථයක් වශයෙන් නොසැලකුණ ද තත්කාලීන තොරතුරු හෙළි කර ගැනීමට මං කියන ඓතිහාසික මූලාශ්‍රයකි.

කතුවරයා විසින් ග්‍රන්ථයට දී ඇති නාමය සද්ධර්මරත්නාවලිය යි. කතුවරයා සිය අරමුණ දක්වමින් ග්‍රන්ථාරම්භයේදී ම "යම් කෙනෙක් කරුණා මදවත් කුශලච්ඡන්දය ඇතිව ධර්මාභියොගයට උපදෙස් ලදින් බණ දැන පිංකම හැසිර නිවන් සාධා ගනිත් නම් එසේ වූ සත්පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්මරත්නාවලී නම් ප්‍රබන්ධයක් කරම්හ" (සද්ධර්මරත්නාවලිය, 1985: 2 පිට) යි සිය ග්‍රන්ථ නාමය ද සනිටුහන් කර ඇත. සද්ධර්මරත්නාවලිය සදහම් රුවන් වැල හෙවත් සද්ධර්මය නැමති රුවන් ඇමුණූ වැල යන අර්ථය ගැබ් වී තිබේ. සැබැවින් ම එය කර්මය, පුනර්භවය වැනි ධර්ම සංකල්ප සරු බසින් හා චඩාත් රසවත් ව ජනතාව අතරට ගෙන යන කෘතියකි. මෙහි කතුවරයා ධර්මසේන නම් යතිවරයෙකු බවත් උන්වහන්සේ යම් සිසු පිරිසකට නායකත්වය දුන් බවත් (යතිස්සරො) ග්‍රන්ථාවසානයේ එන ගාථාවෙන් සනාථ වේ.

ගොවි ජීවිතය පිළිබඳ මනා දැනීමක් ඇති නගරයෙන් හා රාජ සභා ආශ්‍රයෙන් ඈත්වූ තෙවළා දහමෙහි මෙන් ම ලෞකික විද්‍යාවන්හි ද ගැඹුරු දැනුමක් උන්වහන්සේට වූ බවට සද්ධර්මරත්නාවලියේ අන්තර්ගතය සාක්ෂි දරන බව මහාචාර්ය ආනන්ද කුලසූරිය පවසයි (කුලසූරිය, 1963: 74 පිට). ධර්මසේන හිමියන් ගැමියෙකු හා කවටයෙකු ලෙස මාර්ටින් වික්‍රමසිංහ දකියි (වික්‍රමසිංහ, 1956: 138-149). එතුමා එය අගෞරවයක් පිණිස යොදන ලද්දක් නොව උන්වහන්සේගේ නෛසර්ගික කවිත්වය ඇගයීමෙන් ම කරන ලද්දක් බව පෙනේ. සැබවින් ම උන්වහන්සේ ඉතා ගැඹුරින් ගැමි සමාජයට හා ගැමි බසට ලැදියාවක් දක්වා ඇත. නාගරික සමාජයට හෝ භාෂාවට ද්වේෂ කළ බවක් ඉන් ගම්‍ය නොවේ.

සද්ධර්මරත්නාවලියේ ග්‍රන්ථ ප්‍රමාණය දක්වන කතුවරයා කථාවස්තු තුන්සියයකින් ග්‍රන්ථය සරසන බව පවසයි. උන්වහන්සේ ග්‍රන්ථය ආරම්භ කරන්නේ සූවිසි විවරණ කථාවලිනි. ඉන්පසු බුද්ධචරිත කථා දැක්වෙන අතර ඊටත් පසුව චක්ඛුපාල වස්තුව දැක්වේ. කතුවරයා සූවිසි විවරණ කථා හා බුද්ධචරිත කථා ග්‍රන්ථයට ඇතුළත් කර ඇත්තේ ප්‍රස්තාවනාවක් හෝ පෙරවදනක් ලෙසිනි. චක්ඛුපාල මහතෙරුන්ගේ වස්තුවෙහි පටන් වස්තු තුන්සියයක් දක්වන බව පවසන්නේ එබැවිනි.

## ධර්මසේන හිමියන්ගේ පරිවර්තන කුසලතාව

සද්ධර්මරත්නාවලිය වැනි සාරගර්භ කෘතියක් බිහිවීමේ මාතෘත්වය දරනුයේ ක්‍රි.ව. පස්වන සියවසේ ඉන්දියාවේ සිට මෙහි පැමිණ හෙළටුවා පාලියට නැගීමේ ව්‍යාපාරයේ පුරෝගාමියා වූ බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද ධම්මපදට්ඨකථාව යි. සූත්‍රපිටකයේ ඛුද්දකනිකායට අයත් ධම්මපදය වග්ග විසි හයකින් හා ගාථා හාරසිය විසිතුනකින් යුත් කෘතියකි. එම ගාථා මුල් කරගෙන කථා වස්තු දෙසිය අනූනවයක් ධම්මපදට්ඨකථාවේ දක්නා ලැබේ. තව ද ධම්මපදට්ඨකථාවේ නොමැති කථා කීපයක් ද සද්ධර්මරත්නාවලියෙහි දක්නා ලැබේ. නාගසේන මහතෙරුන් වහන්සේගේ කථාව පශ්චාත් පේටක ග්‍රන්ථයක් වන මිලින්දපඤ්හය ආශ්‍රය කර ගෙන ද, කාෂ්ඨවාහන රජුගේ කථාව සුත්තනිපාත අට්ඨකථාව ආශ්‍රය කර ගෙන ද බරණැස් රජුගේ කථාව දීඝනිකාය අට්ඨකථාව ආශ්‍රය කර ගෙන ද රචිත ය. සාතාගිර හේමවත දෙදෙනාගේ උත්පත්ති කථාව, මංගල සූත්‍ර අටුවා ආදි වූ කථා, අනිත්ථිගන්ධ කුමාරයාගේ කථාව බැහැරින් එකතු කර ගන්නා ලද බව පෙනෙයි. එසේ ම ග්‍රන්ථාරම්භයේ එන සූවිසි විවරණ කථා හා බුද්ධචරිත කථා ධම්මපදට්ඨකථාවෙහි දක්නට නැත.

ඒ කෙසේ වෙතත් කතුවරයා කොතැනකින් මූල බීජ සපයා ගත්ත ද එය නව්‍ය ස්වරූපයකින් ඉදිරිපත් කිරීමෙහි සමත් වෙයි. කතුවරයා විසින් ම සිය ග්‍රන්ථය ආරම්භයේ පාලි ක්‍රමය හැර අර්ථය පමණක් ගෙන තමන්ගේ රචනාව කර ඇති බවත් පාලිය අනුගමනයෙහි අඩු වැඩිකම් ඇතත් එය නොසලකා කිරි හා දිය මුසු වූ කල්හි කිරි පමණක් ගන්නා හංසයන් මෙන් ශාස්ත්‍රය පමණක් සලකන ලෙස දක්වා තිබේ. ''පාලි ක්‍රමය හැර අර්ථය පමණක් ගෙන අප කළාවූ ප්‍රබන්ධයෙහි ක්‍රමවිලංඝනාදී

වූ අඩු වැඩි ඇතත් ඒ නොසලකා පැන් හා කිරි මුසු වුවත් කිරි පමණක් තෝරා හැර ගන්නා හංසයන් මෙන් ද ශාස්ත්‍ර දන්නවුන්ගේ ජාති අඩු වුවත් උන්ගේ තරම් නොසලකා ශාස්ත්‍රය පමණක් උගන්නවුන් මෙන් ද ප්‍රයෝජන පමණක් සිතා නුවණ නැමති ඇස්හි මෝහ නැමති පටලය වැසී අකුසල් මහවනට වැද නිවන් පුරයට ගොසින් තුබූ කුසල් මහවත නොදක්නවුන් සද්ධර්මරත්නාවලී නැමති බෙහෙදින් මෝහ නැමති පටලය නැතිකොට නුවණැස අඳුරු හැර කුසල් මහවතට බැස නිවන් පුරවරට සුවයෙන් යායුතු'' ( සද්ධර්මරත්නාවලිය, 1985: 2 පිට).

ධර්මසේන හිමියන් දක්වන පාලි ක්‍රමය හැර අර්ථය පමණක් ගෙන යන ප්‍රකාශය කෙතෙක් දුරට යුක්ති සහගත දැයි විමසිය යුත්තේ ධම්මපදට්ඨකථාව හා සද්ධර්මරත්නාවලිය කෙටියෙන් හෝ තුලනය කිරීමෙනි. පළමුවෙන් මේ දෙකෙහි ආකෘතිකමය වෙනස සැලකිය යුතු ය. ධම්මපදට්ඨකථාවේ පූතිගත්තතිස්ස වස්තුවේ අචිරං වතයං කායොති ඉමං ධම්මදෙසනං සත්ථා සාවත්ථියං විහරන්තො පූතිගත්තතිස්සත්ථෙරං ආරබ්භ කථෙසි (ධම්මපදට්ඨකථා, 1, 1919: 157 පිට) ආදී ලෙස දේශිත ගාථාවේ පාදයක් දක්වා දේශනා කළ ස්ථානය හා තැනැත්තා දැක්වීමෙන් ඇරඹේ. එහෙත් සද්ධර්මරත්නාවලිය මේ කථාව කීමේ අරමුණ පළමුවෙන් දක්වයි. තවද ජීවිතය විදුලියක් මෙන් චිරස්ථිතික නොවන නියාව ද හවුරුදු අසංඛ්‍යයක් සිටියත් දිය බුබුලක් මෙන් බිඳෙන සුලු නියාවත් තණග පිනි බිඳුවක් මෙන් ආයුඃක්ෂයෙහි සිඳෙන නියාව ද දියෙහි ඇඳි ඉරක් මෙන් මැකෙන නියාව ද දක්වන්නමෝ පූතිගත්තතිස්ස තෙරුන්ගේ කථාව දක්වමු. (සද්ධර්මරත්නාවලිය, 1985: 232 පිට). කුම්භඝෝෂක කථාව අරඹන ධම්මපදට්ඨකථාව උට්ඨානවතොති ඉමං ධම්මදෙසනං සත්ථා වෙළුවනෙ විහාරන්තො කුම්භඝොසකං ආරබ්භ කථෙසි (ධම්මපදට්ඨකථා 1, 1919: 115 පිට) යැයි දක්වයි. සද්ධර්මරත්නාවලිය කුම්භඝෝෂක කථාව අරඹන්නේ 'තවද සම්පත් ඇතත් සැපත් මදයෙන් උඩඟු නොව අනුන්ට යටත්ව විසීම නුවණැති සත්පුරුෂ බොහෝ දෙනාගෙන් නිසම්මකාරී රජුන්ගෙන් ගුණ ඇසීමට ද තමන් සැපත් ස්ථිර කරවා ගැන්මට ද ඒකාන්ත කාරණා වන බව හඟවන පිණිස කුම්භඝෝෂක සිටාණන්ගේ වස්තුව දක්වමු' යනුවෙනි.

ධම්මපදට්ඨකථාවේ කථා අවසන් වන්නේ අදාළ ගාථාව හෝ ගාථා හා බැඳුණු ධර්මපද විවරණයකිනි. එහෙත් සද්ධර්මරත්නාවලිය අවසන් කරන්නේ පින්කම්හි හැසිරිය යුතු බවට උපදෙස් දෙමිනි. 'උට්ඨානවතොති උට්ඨානවීරියවන්තස්ස සතිමතොති සතිසමපන්නස්ස සූචිකම්මස්සාති නිද්දොසෙහි නිරපරාධෙහි කායකම්මාදීහි සමන්නාගතස්ස' (ධම්මපදට්ඨකථා 1, 1919: 119 පිට) කුම්භඝෝෂක කථාවේ ගාථාවට පදානුක්‍රමයෙන් අර්ථ දක්වා දේශනාව කෙළවර ඝෝෂක සෝවාන් වූ බවත් බොහෝ ජනතාවට දේශනය හිත පිණිස වූ බවත් දක්වා ඇත. සද්ධර්මරත්නාවලියෙහි කුම්භඝෝෂක වස්තුව අවසන් කරන්නේ එපරිද්දෙන් කුසල්හි තරව අභ්‍යාස කිරීමෙන් අකුසලින් දුරුව ලොවී ලොව්තුරා කුසල් සිතින් සිත් සතන් පවිත්‍ර කට යුතු (සද්ධර්මරත්නාවලිය 1985: 182 පිට) යනුවෙනි. පූතිගත්තතිස්ස තෙරුන්ගේ වස්තුව 'ඛීණාසවස්ස රසපිණ්ඩපාත දානානිසංසෙන

අරහත්තං පත්තොති' (ධම්මපදට්ඨකථා 1, 1919: 159 පිට) යැයි ධම්මපදට්ඨකථාවේ දක්නා ලැබේ. සද්ධර්මරත්නාවලියෙහි 'රහතුන්ට දුන් බතෙහි අනුසසින් නිවන්රස ලදැයි වදාළ සේක' යැයි එය දැක්වෙන අතර ඊටත් පසුව 'සත්පුරුෂයන් විසින් සද්ධර්මරත්නාවලියෙහි ඇවිණි මේ සදහම්රුවන පමණිනුත් පින්කම් නැමති බඩු හොයා ගෙන ලොවී ලොවිතුරා සැපත් සිද්ධ කටයුතු' (සද්ධර්මරත්නාවලිය, 1985: 182 පිට) යැයි උපදේශය දක්වා ඇත. ආරම්භයේ එන අරමුණ දැක්වීමත් අවසානයේ එන උපදේශය දැක්වීමත් ආකෘතිමය වශයෙන් පෙනෙන ප්‍රමුඛතම වෙනස්කම් ලෙස දැක්විය හැකි ය. සැබැවින් ම යමකට ප්‍රවේශ වීමේදී අරමුණක් තිබිය යුතු ය. සද්ධර්මරත්නාවලී කතුවරයා අරමුණ දැක්වීම අටුවාවට වෙනස් මගක් ගන්නවා සේම එය ඔහුගේ කථා කලාවේ ආලෝකයට හේතු වී තිබේ. අරමුණ පැහැදිලි වීම එහි රසය උරා බීමට පහසුවකි. එසේ ම ඉන් විශේෂ උද්දොෘාගයක් ද පාඨකයා තුළ ජනිත වේ.

'තවද සැදැ ඇත්තවුන්ගේ සැදැ වඩනට නිසි වූ අනෙකුත් කථාවක් දක්වන්නමෝ යම්සේ චක්ඛුපාල තෙරුන් වහන්සේ වෙදව උපන් ජාතියෙහි නුවණ නැමති ඇස් මෝහ නැමති පටලය වැසීමෙන් කුසල් නැමති මග ඉඳුරාම නොදැක අකුසල් නැමති විෂම මගට පැමිණ ලසුවුත් අකුසලය නිසා රහත් වූ ජාතියෙහි අන්ධ වීමෙන් මෙසා හානියක් වීද එසේ නොව යම්කෙනෙකුන් නුවණ නැමති පහන් ඇසින් කුසල් මගට බැස ලසුවූත් කුසලයෙහි හැසිරෙත් නම් ඒ නිසා ලබන ලොවී ලොවිතුරා සැපත් මට්ටකුණ්ඩලී වස්තුවෙන් දක්වමු' ... 'චිත්ත ප්‍රසාද පමණකින් මට්ටකුණ්ඩලීන් ලත් සම්පත් ප්‍රකාශ කොට සැදැ ඇත්තවුන්ගේ සැදැ වඩන නිසා මට්ටකුණ්ඩලී වස්තුව දක්වන්නා සේ යම්තම් කුශල විශේෂයකින් බුද්ධි සම්පන්නව ප්‍රශ්න විසඳීම වශයෙන් තෙවළා බුදුවදන් නිරවුල් කළපියා කියා ධර්මාභියෝගයෙහි සත්පුරුෂයන්ගේ උත්සාහ වඩනු පිණිස නාගසේන මහ තෙරුන් වහන්සේගේ වස්තුව කියමු'... 'තවද කලහ කිරීමෙන් අසමගි නිසා වන බොහෝ ආදීනව ද කලහ නොකිරීමෙන් සමගි නිසා වන්නා වූ බොහෝ අනුසස් ද හඟවනු පිණිස කොසඹෑ නුවර වහන්දෑගේ වස්තුව කියමු' ... 'තවද යහපත් අදහස් ඇති කෙනෙකුන්, යහපත් අදහස් ඇති කෙනෙකුන් හාම එක්වන නියාවත්, නපුරු අදහස් ඇත්තවුන් ආලෝකය හා අඳුර එක්ව ගත නොහෙන්නා සේ, ගිනි හා දිය එක් නොවන්නා සේ එක්වගත නොහෙනා නියාවත් දක්වනු පිණිස අගසවු වත දක්වමු'... (සද්ධර්මරත්නාවලිය, 1985: 40, 49, 81, 96 පිටු).

එසේ ම යම් කථාවක් කියා දීමෙන් අනතුරුව එයින් දෙන උපදේශය හෝ ආදර්ශය මිනිස් සන්තානයේ තදින් කා වදී. එබැවින් කතුවරයා ග්‍රන්ථාවසානයෙහි යොදන උපදේශ සමාජ සුචරිත කරණයෙහි ලා මහෝපකාරී වෙයි. 'එසේ හෙයින් සත්පුරුෂයන් විසින් කලහ නමුත් කුසල් සිතකින් කරන දෙයක් නොවන බැවින් අකුසල් නියාව දැන රෑ දුටු වල දවල් පැන හෙන්නා සේ නොව කුසල්හිම හැසිරීමෙන් චිත්ත විශුද්ධිය කටයුතු'...'එහෙයින් නුවණැත්තන් විසින් කෙලෙස් විසින් කෙලෙස් විසිර පවත්නා අකුසලින් දුරුව භාවනා කුසල්හි පිහිටා තදංගාදි වශයෙන්

සිත්සතන් කටයුතු' ... 'කුසල් නැමති බිජුවට තුනුරුවන් කෙත වපුට ලොවී සැපත් නැමති ධාන්‍ය හා ලොව්තුරා ධන රැස් කටයුතු' (සද්ධර්මරත්නාවලිය, 1985ඃ 87, 122 පිටු).

මේ පිළිබඳ අදහස් දක්වන මහාචාර්ය ආනන්ද කුලසූරිය "කථාවක් කියා අවසන් වූ කල්හි ඉන් ලද හැකි ප්‍රයෝජනය හා ගත යුතු උපදේශය පහදාලීම පැරණි සම්ප්‍රදාය යි. ජාතක දේශනාවන්හි ද මෙම පිළිවෙත අනුගමනය කරන බව පෙනෙයි. ධර්මසේන හිමියෝ ද ඒ මග ම ගියහ. උපදේශයක් ගෙන හැර දක්වන්නේ ඉතා මනෝඥ ආකාරයෙනි" යනුවෙන් ප්‍රකාශ කරයි (කුලසූරිය, 1963ඃ 78 පිට). සද්ධර්මරත්නාවලිය ධම්මපදට්ඨකථාවේ පරිවර්තනයක් ද අනුවාදයක් දැයි පිරික්සීමට රචනා ශෛලිය ද විමසිය යුතු ය. මේ ගැන අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ අනික් සිංහල ග්‍රන්ථකාරයෝ පොතින් උපුටා ගත් කථා වස්තු පොතින්ම උපුටා ගත් උපමා උපමේය ආයේ සංකලනයෙන් වර්ණනා කළහ (වික්‍රමසිංහ, 1956ඃ 142 පිට) යැයි දැක්වයි.

> ධම්මපදට්ඨකථාවේ දේවදත්තවත්ථුවේ එන 'පඨමං ඛෙත්තං කසාපෙතබ්බන්ති' යන පාඨය සද්ධර්මරත්නාවලියෙහි ඉතා දීර්ඝව වර්ණනාත්මකව ඉදිරිපත් කෙරේ. කතුවරයා ගොවියා සමග කුඹුරට බැස ගොවිතැන් කරන ආකාරයෙන් වර්ණනාත්මකව ඉදිරිපත් කෙරේ. 'පළමු කොට කුඹුර ගෙවැඩිය යුතුය. ඉක්බිති බිම් නැගිය යුතුය. පසුව දෙසී සැව යුතුය. මියර කෙටිය යුතුය. තුන් සී සාන්ට යුතුය. කැට තළා පෝරු කට යුතුය. කලල්ලම් කටයුතුය. වපුළ යුතුය. වැට බැන්ද යුතුය. ඉස්නන් තෙමිය යුතුය. දිය බැන්ද යුතුය. ගොයම් රෝගයට කෙම් කළ යුතුය. ගොයම් පැසී ගිය කලට දා මැඩ අටුකොටුවල ලිය යුතුය. පෙරළා හිපනැළි සැව යුතුය. වල්පොළ කෙටිය යුතුය. දවා හෙළිකට යුතුය. වපුළ යුතුය. මාස් සමස ගොයම් පැසී ගිය කලත් මෙලෙසම කට යුතුය (සද්ධර්මරත්නාවලිය, 1985ඃ 124 පිට).

මට්ටකුණ්ඩලී සිය පියා හමුවට එන්නේ ඔහු සොහොනේ අඬමින් සිටියදී ය. පැමිණ ඔහු ද අඬන්නට වූ අතර පියා හැඬීමට හේතුව විමසුවේය. හෙතෙම තමන්ගේ රථයට රෝද දෙකක් අවශ්‍ය බවත් ඒ සඳහා සඳහිරු දෙක අවශ්‍ය බවත් දැන්වූ අතර පියා නොපැතිය යුත්තක් පතන ඔබ මෝඩයෙකු බව ද නුඹ මළත් සඳහිරු නොලබන බව ද පැවසුවේය.

> බාලො ඛො ත්‍වමසි මාණව - හො ත්‍වං පත්‍ථයසෙ අපත්‍ථියං
> මඤ්ඤාමි තුවං මරිස්සසි න හි ත්‍වං ලභසි චන්‍දසූරියෙ
> (ධම්මපදට්ඨකථා 1, 1919ඃ 15 පිට)

සද්ධර්මරත්නාවලී කතුවරයා "ළදරුව තෝ ඉතාම නුවණ නැත්තෝය. පැතුවමනා දෙය තබා පොල් ගසින් තල් පක් පතන්නා සේ ගින්නෙන් සිහිල් පතන්නා සේ අකුසලින් කුසල් පතන්නා සේ නොපැතුව මනා දේ පතයි. තා හඬා මියෙතත් ඒ

දෙක ලබන්නට බැරියයි කිවූය" ලෙස මූල ග්‍රන්ථයේ නැති අලංකාර උපමා හතරකින් එය සරසා සිය කුසලතාව ප්‍රකට කරයි. ඕනෑම මූලාශ්‍රයකින් කරුණු ගැනීම කළ හැකි නමුත් එය ස්වීය කරණයෙන් ඉදිරිපත් කිරීම කවියා සතු කුසලතාවකි.

ධර්මසේන හිමියන් ධම්මපදට්ඨකථාවෙහි එන සිද්ධි උපමා කීපයකින් සරසා ස්වීය කරණයෙන් ඉදිරිපත් කිරීම නිසා එය පරිවර්තනයක් බව නොවැටහේ. පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේ රෝගීව අසරණව සිටිනා විට බුදුරදහු ලෝකය දෙස මහා කරුණාවෙන් බලති. එසමයෙහි බුදුරදුන්ගේ නුවණ නැමති දැලට පූතිගත්තතිස්ස තෙරුන් පෙනුනේය. බුදුන් වහන්සේ රහත් වීමට ඔහු සතු ඇති කුශල ශක්තිය බලා මෙතෙම සද්ධිවිහාරිකයන් විසින් ද අත් හරින ලදි. තමන් හැර වෙන පිහිටක් නැතැයි ගඳකිළියෙන් නික්ම විහාර චාරිකාවෙහි හැසිරෙන කල්හි ගිනිහල්ගෙට ගොස් හැළිය සෝදා වතුර ලිපෙහි තබා උණු වන තෙක් එහි ම සිටි බව දක්වේ. මේ සිද්ධිය ධම්මපදට්ඨකථාවෙහි "තස්මිං පන සමයෙ භගවතො පූතිගත්තතිස්සත්ථෙරො පඤ්ඤායි. සත්ථා තිස්සස්ස භික්ඛුනො අරහත්තස්ස උපනිස්සයං දිස්වා අයං සද්ධිවිහාරකාදීහි ඡඩ්ඩිතො ඉදානිස්ස මං ඨපෙත්වා අඤ්ඤං පටිසරණං නත්ථීති ගන්ධකුටිතො නික්ඛමිත්වා විහාරචාරිකං චරමානො අග්ගිසාලං ගන්ත්වා උක්ඛලිං ධොවිත්වා උද්ධනං ආරොපෙත්වා උදකස්ස තත්තභාවං ආගමයමානො අග්ගිසාලායමෙව අට්ඨාසි" යැයි දැක්වේ. (ධම්මපදට්ඨකථා 1, 1919: 157 පිට) කතුවරයා මෙම පාඨය සිංහලට නගන්නේ උපමා නිදර්ශන කථා සිහි ගැන්වීම් කිහිපයක් ද සමග ය. එකල බුදුන්ගේ නුවණ දැල ඇතුළට ඇඟින් කුණු වුවත් රහත් වන්නට නිසි පිනක් ඇති කුණු නොවන පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේ පෙනුණු සේක. බුදුහු උන් වහන්සේගේ සන්තානයෙහි මඩෙහි තිබූ මැණිකක් මෙන් රහත් වන්නට නිසි හේතුවක් දැක මුන් සබ්‍රමසරහුත් පිළිදගින්නට බැරිම හෙයින් අත්හළවුය. කෙලෙස් ලෙඩට පිළියම් දන්නා මා සෙසු ලෙඩටත් දන්නා හෙයින් මා විනා මුන්ට අන් පිහිටක් නැත. තනා මැටියෙන් ගොමින් පිරියම් කට නොහැක්කාක් සේ මුන්ට ඇතිව තුබූ රෝගයට ප්‍රතිකාර නොකොට කෙලෙස් පිළියම් කොට නොහැක්ක. සෙසු කරන්නවුන් නැති කල මා වී නමුත් කළමනා වේදැයි ගඳකිළියෙන් නික්ම වෙහෙර ඇවිදිනා සේක් ගිනිහල්ගෙට වැඩ හුණුපැන් හුණු කරන සැළිය කුස රජ කලත් වළං සෝධා පුරුදු බැවින් සෝධා පියා උදුනේ තබා පුරුදු හෙයින් උදුනේ තබාලා පැන් නගාලා පැන් හුණුවන තෙක් ගිනිහල් ගෙයි පුක්කුසාති නම් කුල දරුවාණන් නිසා කුඹල්හල වැඩහුන්නා මෙන් වැඩසිටි සේක. (සද්ධර්මරත්නාවලිය, 1985: 233 පිට) පාලි පාඨයෙහි සිංහල පදගත පරිවර්තනය හා සද්ධර්මරත්නාවලී පාඨය සසඳන කල්හි කතුවරයා "ඇඟින් කුණු වුවත්, මඩක තුබූ මැණික මෙන්, කෙලෙස් ලෙඩට පිළියම් දන්නා මා සෙසු ලෙඩටත් දන්නා හෙයින්, තනා මැටියෙන් ගොමින් පිරියම් කට නොහැක්කාක් සේ, තුබූ රෝගයට ප්‍රතිකාර නොකොට කෙලෙස් පිළියම් කොට නොහැක්ක., කුස රජ කලත් වළං සෝධා පුරුදු බැවින් පුක්කුසාති නම් කුල දරුවාණන් නිසා කුඹල්හල වැඩහුන්නා මෙන්" වැනි යෙදුම් සිය රුචිකත්වයට අනුව ස්ථානෝචිතව යොදා ගනියි. එයින් පෙළෙහි එන කථා රසය තීව්‍ර වනවා මිස ඊට බාධාවක් නොවේ. පාලි අට්ඨකථාවට වඩා කියවන්නා

හෝ අසන්නා තුළ උද්‍යෝගයක් ඇති කෙරේ. එපමණක් ද නොව බෞද්ධ සාහිත්‍යයේ විවිධ තැන්හි එන පුවත් අදාළ ස්ථානයන්හි යෙදීමෙන් සහෘදයාගේ රසවින්දනය තව දුරටත් වැඩි දියුණු කෙරේ. අනෙක් අතට ධර්මසේන හිමියන් සතු බෞද්ධ සාහිත්‍යය පිළිබඳ ප්‍රඥා මහිමය ද ඉන් සනාථ වේ. විටෙක මූලාශ්‍රය ග්‍රන්ථයෙහි එන කරුණ එලෙසින් ම ඉදිරිපත් කළ ද එක ම උපමාවකින් එහි රසය නව්‍ය ලෙස ඉදිරිපත් කිරීමෙහි ලා කතුවරයාට අනුපමේය කුසලතාවක් විය.

එසේ වුවත් විටෙක ධම්මපදට්ඨකථාවේ පදගත පරිවර්තනයක් සේම ඉදිරිපත් කරන ලද අවස්ථා නැත්තේ නොවේ. "අත්තනො ආපනෙ කිලඤ්ජං පහාරෙත්වා තෙ අංගාරෙ රාසිං කත්වා වික්කිණන්තො විය නිසීදි. ආගතාගතෙසු මනුස්සෙසු යෙ එවං වදන්ති සෙසජනා වත්ථතෙලමධුඵාණිතාදීනි වික්කිණන්ති. ත්‍වං පන අංගාරෙ වික්කිණන්තො නිසින්නොති තෙ වදෙය්‍යාසි අත්තනො සන්තිකං අවික්කණන්තො කිං කරොමීති යො පන තං එවං වදෙති සෙසජනා වත්ථතෙල මධුඵාණිතාදීනි වික්කිණන්ති. ත්‍වං පන හිරඤ්ඤසුවණ්ණං වික්කිණන්තො නිසින්නොති තං වදෙය්‍යාසි කහං හිරඤ්ඤසුවණ්ණන්ති. ඉදඤ්චිදඤ්චාති වුත්තෙ ආහර තව නන්ති හත්ථෙහි පටිච්ඡෙය්‍යාසි" (ධම්මපදට්ඨකථා 1, 1919: 339 පිට) කතුවරයා මෙය සිංහලට නගන අයුරු කිසාගෝතමී වස්තුවේ දක්නට ලැබේ. "තොපගේ සල්පිල්වල කළල් පැදුරු ගෙන්වාලා අතුරුවාලූ ඒ අඟුරු ගෙන්වා ගොඩකරවාලා අඟුරු විකුණන කෙනෙකුන් මෙන් හිඳුව. ඒ තැනට ආ කෙනෙක්, සෙස්සෝ තෙල් මී සකුරු පිළි ආදිය තබා ගෙන විකුණති. තොපි අඟුරු තබා ගෙන විකුණුවයි කියත් නම් තොපි උන්ට මට ඇති දෙය නොවිකුට කුමක් විකුණම්දැයි කියව. යම් කොනක් ආ කල සෙස්සෝ පිළි ආදිය තබා ගෙන විකුණති. තොපි රන් රිදී තබා ගෙන විකුණුවයි කිවූ නම් රන් රිදී කොයිදැයි උන් අතින් විචාරා මේ මේ යැයි කී කල්හි ඒ මේ දේ යැයි උන් ලවා ගෙන්වා තොප අතට ඇර ගනුව..." සැබවින්ම මේ ඡේදය හුදු පදගත පරිවර්තනයක් බඳු ය. මෙබඳු තැන් ඇත ද එය ග්‍රන්ථයේ උසස් භාවයට හානියක් නොවේ. සමස්තයක් ලෙස සලකන කල්හි සද්ධර්මරත්නාවලිය පරිවර්තන කෘතියක් නොව අනුවාදයක් බව ඉඳුරා ම ප්‍රකාශ කළ හැකි ය.

## කථා කලාව

මෙහි එන කථා කලාවේ අංශු මාත්‍රයක් ඉහත අනුමාතෘකාව යටතේ සාකච්ඡා කෙරිණි. සංස්කෘත සාහිත්‍යයේ 'උපමා කාලිදාසස්‍ය' යැයි කාලිදාස උපමා කීමේ දක්ෂතම කවියා ලෙස අගය කෙරේ. සිංහල සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයේ උපමා කීමේ දක්ෂතම කවියා ධර්මසේන හිමියන් යැයි කිවහොත් අතිශයෝක්තියක් නොවේ. ගද්‍ය, පද්‍ය හා මිශ්‍ර ලෙස වර්ගීකරණය කෙරෙන කාව්‍යය අලංකාරයෙන් ශෝභාවත් වන බව කාව්‍යාදර්ශයෙහි පැහැදිලි කෙරේ. ධර්මසේන හිමියන්ගේ කථා කලාව බොහෝ දුරට අගය කරන්නේ උපමා අලංකාරයේ දැක්වූ කුසලතාව පාදක කර ගෙන ය. එහෙත් උපමා භාවිතය එතුමාගේ ප්‍රමුඛ ලක්ෂණය වුව ද ආගමික කරුණු, මිනිස් සිත විවරණය, චරිත නිරූපණය, විවිධ රස නිෂ්පාදනය හා තදීය යුගයේ සාමාජික තොරතුරු උත්පාදනය කෙරෙන මූලාශයක් ලෙස ද අගය කළ

යුතු ය. තවද රූපක, ස්වභාවෝක්ති, අතිශයෝක්ති, උත්ප්‍රේක්ෂා වැනි අර්ථාලංකාර ද අනුප්‍රාසාදී ශබ්දාලංකාර ද භාවිතා කරන බවට සද්ධර්මරත්නාවලිය සාක්ෂි දරයි. සද්ධර්මරත්නාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා උපමාවන්ගෙන් පිරී පවතී. ඒවා විවිධය, විචිත්‍රය, සිත්ගන්නා සුලුය. ධර්මසේන හිමියන් ආයාසයෙන් උපමා යෙදුවෙකු බවක් නොපෙනේ. නිරායාසයෙන් සිය පන්හිඳට නැගුණු උපමා සිය ගණනකින් සද්ධර්මරත්නාවලිය සරසා තිබේ. අර්ථ පැහැදිලි කිරීම හා රසය දියුණු කිරීම සඳහා කතුවරයා විසින් උපමා භාවිතා කෙරිණ. විටෙක එකවර මේ ගුණ දෙක ම දිනා ගැනීමට මේ කතුවරයා සමත් වෙයි. ඊට අමතරව භාවෝද්දීපනය ද සිදුවේ. වරෙක එක උපමාවකින් කරුණ රසවත් හා අර්ථවත් කරන ධර්මසේන හිමි වරෙක උපමා වැලක් ඊට භාවිත කරයි. පැරණි සාහිත්‍යයෙහි භාවිත උපමා නවීකරණයෙන් ද එදිනෙදා ජීවිතයෙන් හා ගැමි පරිසරයෙන්, මිනිස් හා සත්ව ජීවිතයෙන් පොදු ජන ඇදහිලි හා විශ්වාසයන්ගෙන්, ස්වභාව ධර්මයෙන්, ගොවිකමින් හා ගහකොළින් ලබා ගත් උපමා ග්‍රන්ථය පුරා හමුවේ.

රෑ දුටුවල දවල් පැනහෙන්නා සේ, ලුණු නොලා දුවාපු මාලුවක් මෙන්, අනුන්ට ලූ බතක් බලා සිටි පමණකින් බඩ පිරෙන්ට නැත්තාසේ, භෝජානුභවයක් කරවන්නා සේ, සොයා යන බෙහෙද පෙර මග දුටුවා සේ, පිපාසා බලවත් කෙනෙකුන් පැන් ගෙනෙන්නා දැක පෙර මගට ගොසින් පැන් ඉල්වා බොන්නා සේ, කළ පිට වට වැස්සෙන් කළය ඇතුළට ප්‍රයෝජන නැත්තා සේ, වල දර බිඳිනා ගැහැණියක් කෙලෙස් මරහු කියාලූ මෙහෙවරක් හඬගා කියන්නා සේ, හී දඬු මිටියකින් හී දණ්ඩක් හයාගත් කලට අඩුව පෙනෙන්නා සේ, පැන් වත්කළමනා ගසට හුණුපැන් වත් කරන්නා සේ, හස්තසාර ශිල්පයක් සේ, වළඳෙක බොහෝ දෙයක් පටවන්නා සේ වැනි උපමා ගැමි පරිසරයෙන් ද පුස්කා ගිය පැණි කැවුම් සේ, මග යෙමින් සිටම මග කොයි දැයි තමන් විචාරන්නා සේ, රූපත්ව උපන්නාට සිරගෙයක ලූවා සේ, කිරිබොන දරුවන් මැණියන් දුටු කලට කිරට එලෙන්නා සේ, මිහිරි දෙයක් ලදින් භාගයක් අනුභව කොට ලා භාගයක් හිණ තබාගෙන අවුත් දෙන කෙනෙකුන් මෙන්, වස්නා වැසි බෝවා සේම ප්‍රසව දුකුත් බෝවිය, සිරුර දාගිය කෙනෙකුන් මහ අච්චේ ලූවා සේ, බර එසවිය නොහෙන්නාවුන්ට ශරීර භාරයම සැහෙන්නා සේ, පිරිමින්ට ගැණු පළඳනා තරම් නොවන්නා සේ, ගැණුන්ට පිරිමි වෙස්  තරම් නොවන්නා සේ, පිපාසා බලවත්ව ලත් පැනක් සැතපී සැතපී බී පියන්නාක් සේ වැනි උපමා මිනිස් ජීවිතයෙන් ද යම් සේ කැරලු හැඩීමෙන් අනුන්ට වන වැඩ අවැඩ හගවත් ද, සමහර විෂයක් බානාකල දෂ්ට කළ සර්පයා ලවාම උරවා ගන්නා සේ, පෙණපිඬ මෙන් දෙවියෝ දිවමල් වැස්වූහ, මඟුලෙන් හෙලාලූ කප උගුළුවන්ට බැරියා සේ වැනි උපමා පොදු ජන ඇදහිලි හා විශ්වාසයන්ගෙන් ද තනා මැටියෙන් ගොමින් පිරියම් කට නොහැක්කා සේ, පොල් ගසින් තල්පක් පතන්නා සේ, පැලය නැගී මුහුකුරන කලට බිජුවට ඇට දිරා නැතිවන්නා සේ, මරාලූ ගසක වැදගත් ගින්නක් මෙන්, ගොයම් කළ කෙනෙකුන් ගොයම් මිස පිදුරු පමණකුත් නොලද්දා සේ වැනි උපමා ගොවිකමින් හා ගහකොළින් ද හැද නොහැරෙන දඬු ගින්නට පෑ තවාලූ කල හැද හැරෙන්නා සේ, අසූචි පිරුණු කළයක් පිට සිත්තම් කරන්නා සේ, පිපෙන මල්

පිපී මුත් නොනවත්නා සේ, වේයන් කෑ පරඬැල් පතක් මෙන්, මඩක තිබූ මැණිකක් මෙන්, ඇවිළෙන පහනම පෙවූ අතට සම්භ වූ ආයුධයක් මෙන්, පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ, ඇස් සරසන්නට තොල අඳුන් ගානා සේ, සිදුරු ඇති කළයක වත් කළ පැන් නොරඳන කලක් මෙන්, මූදට නැමුණු මහ ගඟක් සේ, පිට පිට හෙළා විදුලිය ගස්නා සේ විළිත් පහරනට වන, ආස ගුගුරන්නාසේ, කුණු කසළට කසළ ගොඩ ආධාරය සේ, යහපත් පෑයක් ගන්නට වයිති හනන්නා සේ, පොළොව පස් බොහෝ කොට බඩ පුරා කෑවහොත් පසුව සැගවී වැදහෝනා තැනුත් නැතැයි යන විරුද්ධ කල්පනාවෙන් ගැඩවුලුන් පස් සුඟ කොට කන්නා සේ, කොස්වාළිහිණියන් නොසැලී සිටින කලට පොළොව දරාලිය නොහෙති යි යන විරුද්ධ කල්පනාවෙන් පෙඳ සලන්නා සේ, ආඳා යවා තබාලා වල්පත ගත්තා සේ වැනි උපමා ස්වභාව ධර්මයෙන් හා ජනසමාජයෙන් ද ජීවිතය විදුලියක් මෙන් චිරස්තිථික නොවන නියාව ... දිය බුබුලක් මෙන් බිඳෙන නියාව ද ... තණග පිනි බිඳුවක් මෙන් ආයුක්ෂයෙහි සිඳෙන නියාව ද දියෙහි ඇඳි ඉරක් මෙන් මැකෙන නියාව ද, නැකැත් තරු පිරිවරා නික්මුණු සඳ පරිද්දෙන්, යුගඳුරු මුදුනෙහි චොරජනා ළහිරු මඬලක් මෙන්, රන් නැවක් මධ්‍යකොට පිරී වැහී ගිය රත් නෙළුම් වනයක් මෙන් වැනි උපමා පැරණි සාහිත්‍යයෙන් ද යොදා ගෙන තිබේ.

ඉහත දක්වන ලද උපමාවන්ගෙන් කතුවරයාගේ උපමා කථනයෙහි සාමාර්ථ්‍යය මොනවට පැහැදිලි වේ. තිස්ස තෙරුන්ගේ ඇඟ පුරා අබ ඇට තරමින් ඇරඹී ගෙඩි බෙලි ගෙඩි පමණ වන සේ ලොකු මහත් වී සැරව ගලන්නට විය. උන්වහන්සේගේ ශරීරය වේයන් කෑ පරඬැල් පතකට සමාන කිරීම කෙතරම් අපූරු ද? රෝගී තත්ත්වය නිසා ම පූතිගත්තතිස්ස තෙරුන්ගේ ශරීරය පරඬැල් පතක් සේ දුර්වර්ණ වන්නට ද ඇත. ඇඟින් කුණු වුව ද නිවන් දැකීමේ හේතු සම්පත් කෙනෙකුට තිබිය හැකිය. ඒ හේතු සම්පත මඩක තිබූ මැණිකක් මෙන් ප්‍රබලය. මැණික මඩක තිබුණ ද එහි අගය අඩු නොවේ. පටාචාරාගේ විළි රුදාව 'පිට පිට හෙළා විදුලිය ගස්නා සේ විළිත් පහරන්නට වන' යැයි විදුලි කෙටීමකට සමාන කරයි. දරුවෙකු බිහි කිරීමේදී ඇති වන වේදනාව කෙතරම් බිහිසුණු දැයි සිතේ. විදුලි කෙටීම බිය දනවන සුලු වුව ද ඉන් පසු කඩා හැලෙන වැස්ස ගම් බිම් තෙමමින් සෞභාග්‍යය උදා කරයි. මවක විළි වේදනා විඳ දරුවෙකු බිහි කිරීමෙන් ලබන ආශ්වාදය මහවැස්ස මෙනැයි කතුවරයා සහෘදයාට හැඟෙන්නට සලස්වයි.

ඉතා රූමත් තරුණියක වූ කුණ්ඩලකේසී සිය ගෙදර අනවශ්‍ය ආරක්ෂාකාරී තත්ත්වයකින් පීඩා විඳි බව පෙනේ. දෙමාපියන්ගේ අධික ස්නේහයත් ඇයගේ අධික රූප ශෝභාවත් නිසා ඇයට අධි ආරක්ෂාව සැලසිණි. ඉන් තරුණ මානවිකාව පීඩා විඳි බව 'රූපත්ව උපන්නාට සාටෝපයට සිරගෙයක ලූවාසේ' යන උපමාවෙන් ඒත්තු ගන්වයි. අදින්නපුබ්බක සිය පුතා සෙනෙහසින් රැක්කේ නමුදු ඊට අධිකව මසුරුකමින් පෙළුනේය. රෝගී පුතාට තැන තැන ඇවිද ගොඩ වෙදකම් කිරීම නිෂ්ප්‍රයෝජන බව කතුවරයා දක්වන්නේ 'පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ, ඇස් සරසන්නට තොල අඳුන් ගානා සේ' යන උපමා දෙකෙනි. පයෙහි බරවායට පිටෙහි බෙහෙත්

ගා ඵල නැත. ඇස් සැරසීමට නම් අඳුන් ඇසේ ගෑ යුතු ය. එය තොලෙහි ගෑමෙන් ඵල නැත. මෙහි උපමා සියුම්ව උපහාසය මතු කරයි. රාජාභිෂේකය, ගෘහ ප්‍රවේශය, විවාහය යන මංගල්‍ය තුන යෙදී තිබුණු දින නන්ද කුමාරයාගේ නිවසට වඩිනා බුදුරදුහු නන්ද කුමාරයාට පාත්‍රය දී දෙව්රමට වඩිති. නන්ද කුමාරයා පාත්‍රය දැන් දැන් ගනීවිය යන හැඟීමෙන් බුදුරදුන් පසුපස යයි. සුදොවුන් රජ මෙය ජනපද කල්‍යාණියට දන්වන අතර ඇය හිස සෝදමින් ම අවුත් ගියත් ඉක්මනට එන්නැයි කීවාය. එය නන්ද කුමාරයාගේ සිතෙහි ඉතා තදින් බැඳ ගත්තේය. 'දිවුල් ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ' එය හිතෙහි වැදුණු බව ධර්මසේන හිමි කියයි. ආදරය දිවුල් ලාටු සේ ඇලෙන බවත් එය සායම් සේ විනිවිද යන බවත් කීමට මේ උපමාව කෙතරම් සමත් දැයි බලනු මැනවි. නාගසේන කුමාරයා නිසි වයසේ ශිල්ප උගෙන අවසන්ව කලකිරීමට පත්ව සිටියි. රෝහණ මහතෙරුන් වහන්සේ මෙය දැන එහි වඩිති. කුමාරයා ශිල්පයෙහි සාරය සොයමින් සිටී. තෙරුන් වහන්සේ එහි වැඩීම 'සොයා යන බෙහෙද පෙරමග දුටුවා සේ' යි උපමා කෙරේ. කුමාරයාට ශිල්ප සාරය අවශ්‍ය මොහොතේ මේ අහඹු හමුවීම කෙතරම් ප්‍රීතිජනක වන්නට ඇද්ද? එම ප්‍රීතිය සොයා යන බෙහෙත පෙරමග හමු වීමට කෙතරම් සමාන ද? කොසඹෑ නුවර භික්ෂූන් වහන්සේලා අතර ඇති කලහය දුර දිග යෑම නිසා අවවාද දී විසඳනු නොහැකි වූ බුදුන් වහන්සේ වනගත වූහ. උපාසකයෝ දන් දීම අත්හළහ. පසුව බඩගින්නෙන් පීඩා විඳීම නිසා භික්ෂූහු එකිනෙකා වරද කමා කරගෙන උපාසකයන්ට සමගි වූ බව දැන්වූහ. අනතුරුව අනඳ හිමියන්ගේ මැදිහත්වීමෙන් බුදුරදුහු නැවත ආරාමයට වැඩම කළහ. අසමගි වූ භික්ෂූන්ගේ සමගි වීම "හැද නොහැරෙන දඬු ගින්නට පෑ තවාලූ කල හැද හැරෙන්නා සේ" යැයි උපමා කරති. උපාසකයන්ගේ ක්‍රම නැමති ගිනි රැසින් කලහ නැමති ඇද හැරුණු බව කතුවරයා දක්වයි. එපමණක් නොව බඩගින්න ලෝ සතුන්ගේ පළමු ගැටලුව බැවින් එම ගින්නෙන් පීඩා විඳීම නිසා කලහ නැමති ඇද හැරුණු බව අදහස් කළ හැකි ය.

ධර්මසේන හිමි උපමා කථනයෙහි සුවිශේෂ කුසලතාවකින් යුක්ත වූවා සේ ම රූපක, ස්වාභාවෝක්ති ආදි අලංකාර කථනයෙහි ද සමර්ථය. විදසුන් නැමති අතින්, මාර්ගඥාන නැමති කඩු, කෙලෙස් සතුරන්, පින්කම් නැමති බඩු, නුවණ දැල, කුසල් නැමති මග, නුවණ නැමති පහන් ඇසින්, සසර නැමති මුහුදින්, මාර්ග ඵල නැමති නැවෙන්, කථා ප්‍රබන්ධ නැමති රන් කෙන්දෙහි, සිහි නැමති දොර පියාලා, නුවණ නැමති අගුළුලාලා, සතන් නැමති නුවර, ෂඩාලම්බන නැමති වල්හි, සක්වල නැමති මහ මුහුද වසා නුවණ දැල, සද්ධර්මරත්නාවලී නැමති කැටපතින්, සදහම් නැමති මුහුණ බලා, කෙලෙස් අඳුරු, සර්වඥ විලාස නැමති රසාඤ්ජනය වැනි රූපකාලංකාර නිදර්ශන සේ සැලකිය යුතුය.

ඇතැම් අවස්ථාවක එක ම වාක්‍යය රූපාලංකාර කීපයකින් සරසයි. අදින්නපුබ්බක පුතාගේ අභාවයෙන් පසු සොහොනේ හඬා වැටෙමින් සිටි අතර එහි පැමිණි මට්ටකුණ්ඩලී දෙව්පුත් ඔහුගේ දුක අනුශාසනාවකින් අඩු කරයි. මෙය රූපාලංකාර කීපයක් යොදා ගෙන වර්ණනාත්මකව ඉදිරිපත් කෙරේ. 'මාගේ

සන්තානයෙහි දරුශෝක නැමති ගින්න වැදගෙන අදහස් නැමති ගම් ගෙවල් දවනුවා තෙපි තොපගේ අනුශාසනාව නැමති පැනින් නිවාපුව' බුදුරදුන් මසුරු බමුණාට අනුශාසනා කළ බව අලංකාරෝක්තියෙන් 'අද වූකලී මේ සම්‍යක් සම්බුද්ධ නැමති සූර්ය තෙමේ සැදැහැ නැමති බමුණන්ගේ මිථ්‍යා දෘෂ්ටි නැමති අඳුරු හරවනු නිසා දේශනා නැමති ආලෝකයෙන්....' යැයි දක්වේ. අනුශාසනාවෙන් සෝවාන් ඵලය ලබන මට්ටකුණ්ඩලී ගැන ඔහුගේ අන්වර්ථ නාමයට ද ගැළපෙන සේ රූපක යොදා සරසයි. 'මට්ටකුණ්ඩලී දෙව්පුත් දහසක් ණය නැමති රන් රුවන් ඔබ්බවා කළ සෝවාන් ඵල නැමති මිණිකොඬොල් ලා සැරහිණි. කොසඹෑ නුවර පන්සියයක් භික්ෂූන් වහන්සේ බුදුරදුන්ගේ බණ අසා තුන් මසකට පසු රහත් වූහ. බුදුන්ගේ ම බණක් අසන්නට සිතා තුන් මසක් විතරින් ලත් බණක් හෙයින් කන් නැමති දහසක් ගොටුවල වත් කරවා ගෙන සිත් නැමති තුඩුවලින් උරා බී සව්කෙලෙස් පැන්පවස් සදහම් නැමති පැනින් සන්සිඳුවා රහත් වූ සේක.' මළමිනියක දැවීයාම බලා සිටි මහාකාල තෙරණුවෝ රහත්ඵලය ලැබූහ. 'සසර මහ මුහුදට ගලා වදනා තෘෂ්ණා නැමති ගඟ අවුරා විමසුම් වැට බැඳ විදර්ශනා නැමති පැන් රඳවාලා කෙලෙස් මහවතුරෙන් පිරුණ සසර මහමුහුද අරහත් මාර්ග ඥාන නැමති වඩබා මුඛයට වද්දා සසර මුහුද නැති කොට සසර නැමති මහ මුහුදින් එතෙර ව නිවන් රට ලදින් අරහත් ඵල සමාපත්ති නැමති රටබද්ද ලත් සේක' (සද්ධර්මරත්නාවලිය, 1985: 91 පිට).

උපමා, රූපක අලංකාරයෙහි පමණක් නොව ස්වාභාවෝක්ත්‍යාදී අලංකාර කථනයෙහි ද කතුවරයා සමත් ය. ඇති දෙය ඇති සැටියෙන් කීම ස්වභාවෝක්ති නම්. දේවදත්ත වස්තුවෙහි හමුවන සසර හා ගොවිතැන පිළිබඳ වර්ණනය ස්වාභාවෝක්ති වර්ණනයකි. ගැමි පරිසරයක හැදී වැඩී ග්‍රන්‍ථකරණයට බට ධර්මසේන හිමි අනායාසයෙන් ස්වාභාවෝක්ත්‍යාලංකාරය යෙදුවෙකි.

අනුප්‍රාසාදි ශබ්දාලංකාර ද ග්‍රන්‍ථය පුරා විසිර පවතී. බුදුන් වහන්සේ රක්ඛිත වනයේ වස් විසූ තෙමස තුළ පාරිලෙය්‍ය නම් ඇතා උන්වහන්සේට උවටැන් කළ අයුරු අනුප්‍රාස රසයෙන් අනූනව වර්ණනා කරයි. 'බුදුන් වස් වැස වැඩහුන් කල්හි වස් තුන් මස ම කළය සොඬින් හැරගෙන ගොසින් බොන පැනුත් ගෙන තබාලති. නහන පැනුත් ගෙන තබාලති. හුණුපැන් වුවමනා විට දණ්ඩක් කඩා ගෙන ගිනි ගා හෙළා පියා දරලා ගිනි මොළවාලා ගලක් පෙරළා ගෙන අවුත් ගින්නේ ලා රත් කොට දණ්ඩකින් ගල පෙරළා ගෙනවුත් කුඩා ගල් කෙමෙක හෙළාලා පැනිත්ත හුණු කල්හි ....''(සද්ධර්මරත්නාවලිය, 1985: 84 පිට). කෙටි වැකි හා දිග වැකි එකට මැනවින් මුසුකොට කරන ලද මේ අපූරු වර්ණනය සහෘද සිත් පුබුදු වන සුලු ය.

## සදාචාරාත්මක අගය

ග්‍රන්ථකරණයේ පරමාර්ථය දැක්වූ පාඨයෙහි ද බුද්ධිය හීන වුවත් කුසල් කිරීමෙහි කැමැත්තවුන්ගේ යහපත සඳහා ග්‍රන්ථය කරන බව තහවුරු වෙයි. මෙහි පාඨකයා ලෙස තෝරා ගෙන ඇත්තේ බොහෝ දුරට ගැමි ජනතාව යැයි සිතීම නිරවද්‍ය ය. ධර්මසේන හිමියන් ගැමියෙකු වුව ද උන්වහන්සේට අවශ්‍ය ගැඹුරු

ධර්මඥානය තිබුණු බවට පරමාර්ථ පාඨය ම සාක්ෂි දරයි. උපාධි ලබාගෙන නුවණ දියුණු කර ගත්ත ද යහපතෙහි හැසිරීමට වුවමනාවක් නැති උගත් සමාජයට ග්‍රන්ථයක් නිම වීමට වඩා එබඳු උගත්කම් නැතත් යහපතෙහි හැසිරීමට රුචි සත් පුරුෂයන් සඳහා ග්‍රන්ථය රචනා කිරීම සප්‍රයෝජනවත් විය හැකි ය. උන්වහන්සේගේ අරමුණ වූයේ ආචාර ධර්මවලින් පිරිපුන් සමාජයක් බිහි කිරීමට අවශ්‍ය, පොදු ජනතාවට රස විඳිය හැකි මූලික ධර්ම සංකල්ප ද විවරණය කරන ග්‍රන්ථයකි. කෙළවර නිර්වාණ සාධනය ද අපේක්ෂිත ය. සද්ධර්මරත්නාවලිය එම බලාපොරොත්තුව මල්ඵල ගන්වා ඇත. උගත් යැයි සම්මත සමාජයට තර්ක බුද්ධියෙන් සමුපලක්ෂිතව මෙය ඉදිරිපත් කරන ලද්දේ නම් මේ තරම් ජනාදරයට පත් නොවන්නට ඉඩ තිබුණි. එසේ ම සිංහල ජන විඥානයේ වෙනසක් ඇති කිරීමට ද සමත් නොවන්නට ඉඩ තිබුණි.

බටහිර දර්ශනයේ ඒක දේශයක් වන ආචාර විද්‍යාව බෞද්ධ දර්ශනයේ පදනම සේ සැලකේ. සමාජයක යහ පැවැත්ම පිණිස ආචාර ධර්මයන්ගෙන් සිදුවන මෙහෙය ලඝු කොට සැලකිය නොහැකි ය. බෞද්ධ ශික්ෂා මාර්ගයේ ආචාරධර්ම ත්‍රිශික්ෂාවේ ශීලය ගැඹුරින් ස්පර්ශ කෙරෙන අතර සමාධි හා පඤ්ඤා සමඟ ද බැඳේ. අන්‍යයන් තලා පෙළා ජීවත්වීම නොව අන්‍යයන් හා සුහදශීලීව කටයුතු කිරීම පින් පව් අදහන සමාජ සංස්ථාවකින් අපේක්ෂා කළ හැක්කකි.

යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං
කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරී ච පාපකං

(සංයුත්තනිකාය 1, 1960 404 පිට)

වපුළ බිජුවට සමාන ඵල ලැබෙන්නා සේ යහපත් ක්‍රියාවෙහි ප්‍රතිඵල යහපත් ද අයහපත් ක්‍රියාවෙහි ප්‍රතිඵල අයහපත් ද වන බව බෞද්ධ කර්මයෙහි එක් පැතිකඩකි. කර්මය, පුනර්භවය වැනි සංකල්ප ජන මනසේ ස්ථාවර වන තරමට එයින් පාපයෙහි භය හා ලජ්ජාව ඇති වන බැවින් සමාජය වඩාත් සුඛිත මුදිත වේ.

චක්ඛුපාල තෙරුන් වහන්සේගේ වස්තුවෙහි එන පරිදි උන්වහන්සේ මනා කැපවීමෙන් භාවනා කොට රහත්ඵලය සාධනය කර ගත්හ. එහෙත් උන්වහන්සේගේ රහත් ඵලයත් සමග ම දෑස් අන්ධ වීම ද සිදු විය. මීට හේතුව උන්වහන්සේ පෙර භවයක වෛද්‍යවරයෙකු ව සිටියදී දුප්පත් කාන්තාවකගේ ඇස් අන්ධ කරවීම බව ද පැහැදිලි කෙරේ. ශ්‍රාවකයා තමන්ට අලාභයක් වුව ද මෙවැනි සාපරාධී ක්‍රියාවල අනර්ථකාරීත්වය නුවණින් දැක ඉන් වැළකීමට වෙහෙස දරයි. සෑම සත්ත්වයෙකු ම වැඩියෙන්ම ආදරය කරන්නේ තමන්ට බැවින් කළ නරක තමන්ට මේ භවයේ දී විපාක නොදුන හොත් සසර දී විපාක දෙන බව ඒත්තු ගැන්වීම පවට බිය දනවන්නකි. එයින් සහෘදයා පාපයෙන් ඈත්වීමට වෙහෙසෙන අතර පුනබ්භව සංකල්පය ද තහවුරු වේ. මට්ටකුණ්ඩලී වස්තුවෙහි කුමාරයා දිව්‍ය සම්පත් ලබන්නේ බුදුරදුන් දැක සිත පහදවා ගැනීමෙනි. කුසලය කුඩා වුවත් එහි ඵලය මහත් බව එහි කියැවේ.

වෛරය වෛරයෙන් නොසන්සිඳෙන බව තහවුරු කිරීමට ඉදිරිපත් කරන කාලි නම් යකින්නගේ වස්තුව මිනිස් සන්තානයෙහි මෛත්‍රිය වර්ධනය කිරීමෙහිලා උපයෝගී වෙයි. මූත්‍රා වැටුණු තැනක් මලමූත්‍රාවලින් ම පිරිසිදු කළ නොහැකි ය. ඒ සඳහා පිරිසිදු ජලය අවශ්‍ය ය. එමෙන් ම වෛරය නැමැති මලමූත්‍රා මෛත්‍රිය නැමැති පිරිසිදු සිසිල් ජලයෙන් පිරිසිදු කළ යුතු ය. මෛත්‍රිය ඇති තැන සමාජය සුවපත් වේ. ආයුෂ, වර්ණ, සැප, බල, ප්‍රඥා යන සම්පත් පහක් ලැබේ. නිරෝගී මිනිසුන් වෙසෙන වෛරයෙන් තොර සමාජ සංස්ථා බිහි කිරීම ආගමෙන් අපේක්ෂා කළ යුත්තකි. කාලි යකින්න මිනිස් මවගේ පළමු හා දෙවන දරුවන් කන්නේ සසර බැඳගත් වෛරය නිසා ය. ඒ වන විට ආත්මභාව තුනක් ඒ වෛරය මාරුවෙන් මාරුවට මේ දෙදෙනා පවත්වාගෙන ආහ. මෙයින් පාපය පිළිබඳ බියක් ද පුනර්භවය පිළිබඳ විශ්වාසයක් ද ඇති වේ.

ආගමික සංස්ථාවක යහ පැවැත්ම පිණිස සාමග්‍රිය අනල්ප මෙහෙයක් ඉටු කරන අතර අසමගිය සංස්ථා පරිහානිය ඇති කරයි. කොසඹෑ නුවර වහන්දෑගේ වස්තුව අසමගියේ ආදීනව හා සමගියේ අනුසස් උගන්වන්නකි. චුන්ද නම් ඌරු වැද්දාගේ වස්තුව සත්ත්ව ඝාතනයේ විපාක දිට්ඨධම්මවෙදනීය ලෙස ලැබෙන බව සනාථ කරන්නකි. සත්ත්ව ඝාතනයෙන් වැළකිය යුතු බව මිනිස් සිතට ප්‍රබල ලෙස මේ කතා වස්තුව කියාපායි. පරලොව ද නිරාදුක් විඳින බව දැක්වීම එම හැඟීම තියුණු කරයි. පින් කළ තැනැත්තන් පිළිගැනීමට දෙව්ලොව දෙව්වරුන් පවා සූදානමින් සිටින බව ධම්මික උපාසකයාගේ වස්තුව කියාපායි.

නිල ඇඳුම නිලයේ බර දැරිය හැකි අයෙකු ඉසිලිය යුතු ය. කාසාව පරිදහන වස්තුව අනුව චීවරය නුසුදුස්සන් දැරීමෙන් සංස්ථාවට ද අගෞරව වන බව පෙනේ. සසර ද ඔහු එවැනි ම පාපතර ක්‍රියාවල නියැලුණු බවට අතීත කථාවක් ද එහි එයි. ලාභ ප්‍රයෝජන ඉතා දරුණු යැයි වරෙක බුදුරජාණන් වහන්සේ වදාළේ එබැවිනි. කුඩා කල හටගත් වෛරයෙන් කිඹුල්වත් නුවර ශාක්‍යයන් විනාශ කළ විඩූඩභ රජතුමා සැවැත් නුවරට යන අතරමඟ අචිරවතී ගඟ අසබඩ කඳවුරු ලා ගත් අතර එදින රෑ ගං වතුරින් මූදට ගලාගෙන ගොස් මිය ගියේය. නපුර කළවුන් වෙත ස්වභාව ධර්මය හෝ ඊට අදාළ විපාකය ලබා දෙන බව මින් සනාථ වේ. මෙලෙස කර්මය හා පුනර්භවය සනාථ වන කතා කලාවකින් සහෘදයාට ආගමානුකූලව ජීවත් වන්නට ප්‍රේරණයක් ඇති කෙරේ.

## මනෝභාව ප්‍රකාශනය

සද්ධර්මරත්නාවලිය ආගමික වැදගත්කමකින් යුක්ත ග්‍රන්ථයක් වනවා සේ ම මිනිස් සිත විනිවිද දකින ග්‍රන්ථයකි. සුදු කලු ලෙස වර්ගීකරණයෙන් තොර රචුම් චරිත යථාර්ථ රීතියෙන් ඉදිරිපත් කිරීම කතුවරයාගේ කුසලතාව ප්‍රකට කරයි. සත්ත්වයා සතු ෂඩින්ද්‍රියයන්ගෙන් ඉතා ප්‍රබල අංගය සිත (චිත්ත) ලෙස හැඳින්වීම නිවැරදි ය. මිනිස් මනසේ ගැඹුරු අභ්‍යන්තරය තුළ හට ගන්නා රාගය, ප්‍රේමය, වෛරය, ඊර්ෂ්‍යාව, ද්වේෂය, මුළාව වැනි කරුණු ග්‍රහණය කර ගැනීමට සියුම් බුද්ධියක් තිබිය යුතු ය.

ධර්මසේන හිමියන් මිනිස් සිත විනිවිද දැකීමේ සියුම් හැකියාවෙන් සිය කතා කලාව පෝෂණය කරගෙන තිබීම කෘතියෙහි සාර්ථකත්වයට බෙහෙවින් උපකාරී වී තිබේ.

මිනිසෙකුගේ ඇස බැඳ තැබීමට ස්ත්‍රී රූපය තරම් රූපයක් ද කන බැඳ තබන ස්ත්‍රී ශබ්දය තරම් ශබ්දයක් ද  ස්ත්‍රී ගන්ධය තරම් සුවඳක් ද ස්ත්‍රී රසය තරම් රසයක් ද ස්ත්‍රී ස්පර්ශය තරම් පහසක් ද නැත. ස්ත්‍රියට ද පුරුෂයා මෙබඳු ම යැයි බුදුන් වහන්සේ වදාළහ (අංගුත්තරනිකාය 1, 1960: 2-5 පිටු). චක්ඛුපාල තෙරුන් වහන්සේ සමග වැඩි අතවැසි භික්ෂුව වන මැද දී ස්ත්‍රියකගේ ගී හඬක් අසා ඈ සොයා යයි. රාගික හැඟීම් ඵල ගන්වාගත් ඔහු යළිත් තෙරුන් වහන්සේ ළඟට එයි. ස්ත්‍රිය බලවන්තයන් දුබල කරන බව ද ශක්තිවන්තයන්ගේ ශක්තිය විනාශ කරන බව ද ඇස් ඇත්තන් අන්ධ කරන බව ද එනිසා ම ඇය වසංගතයක් බව ද මෙහිදී පැවසේ. අතවැසි භික්ෂුව මහණදම් පිරුව ද රහත් ඵලය සාධනය කර නොගත් බැවින් තාවකාලිකව යටපත් කර තිබූ රාගික හැඟීම් ඉස්මතු විය. නන්ද තෙරුන්ගේ වස්තුව ප්‍රේමයේ ඇති විවිධ ස්වරූප විනිවිද දකී. බුදුරදුන් පසුපස පාත්‍රය රැගෙන යන විට ජනපද කල්‍යාණියගේ 'ඉක්මනට එන්න' යන වදන දිවුල් ලාටුවල සායම් උරන්නා සේ නන්ද කුමාරයාගේ සිතෙහි කාවැදිණ. දෙව්රම් වෙහෙර ද ඇය ගැන ම සිතමින් කල් ගෙවූ නන්ද හිමි දිව්‍ය කාන්තාවන් දැකීමෙන් ලස්සන සාපේක්ෂකව දකින්නට පටන්ගනී. සාමාන්‍යයෙන් මිනිස් මනස වඩා සුන්දර දෑ සොයා යෑමේ ලක්ෂණයෙන් යුක්ත ය.

කිසාගෝතමී වස්තුව දාරක ප්‍රේමය සිහි මුළා කරවන බව සනාථ කරන්නකි. එදිනෙදා සමාජයේ සිදුවන සියල්ල අමතක කොට දමා නොමළ ගෙයකින් අබ සොයෑ යෑමට ද කිසාගෝතමිය පෙළඹෙන්නේ දාරක ප්‍රේමය විසින් විශ්ව යථාර්ථය යට කරන ලද බැවිනැයි හැඟේ. මට්ටකුණ්ඩලී වස්තුව දාරක ප්‍රේමය හා තණ්හාව අතර සටන් වදින මිනිස් සිතක තත්ත්වය හෙළි කරයි. අදින්නපුබ්බක සිය පුතාට කුණ්ඩලාභරණ තැනීම තමන් විසින් ම කරන්නේ හැදුම් කුලිය අඩු කර ගැනීමට ය. මට්ටකුණ්ඩලී පාණ්ඩු රෝගයෙන් පෙළෙන්නට පටන් ගත් කල්හි ද ඊට වෙදෙකු නොකැඳවන්නේ අධික මසුරුකම නිසා ය. පුතා බෙහෙවින් අසාධ්‍ය වූ කල්හි ආඳා යවා තබාලා වල්පත ගත්තා සේ වෙදවරුන් ගෙන්වන අවස්ථාවේ රෝග හානියටත් වඩා වස්තු හානිය නොකැමැතිව නොගෙන්වා අතේකිච්ඡ අවස්ථාවෙහි වෙදාණ කෙනෙකුන් ගෙන්වා නිෂ්ඵල ක්‍රියාවක් කරයි. තද මසුරා මසුරුකමින් වෙලී පහසුවෙන් කර ගත හැක්කක් අධික වියදමක් දක්වා වැඩි කර ගනී. අදින්නපුබ්බක ස්වකීය පුත්‍රයා පිළිබඳ ප්‍රේම රහිත වූවේ නොවේ. පුත්‍ර ප්‍රේමය මැඩගෙන වස්තු ලෝභය මතුව එයි. පුතාගේ අභාවයෙන් පසු වස්තු ලෝභය පරදවා දාරක ස්නේහය ඉස්මතුවූ බව රන් රිදියෙන් හෝ චක්‍ර යුගලයක් කර දීමට එකඟ වීමෙන් තහවුරු වේ. දරුවා ඉර හඳ සිය රථයේ රෝද දෙකට ගැළපෙන බව කියයි. පියා එය නොලැබෙන බවත් ඒ වෙනුවෙන් හැඬීම මුග්ධතර ක්‍රියාවක් බවත් පවසයි. අදින්න පුබ්බක නොපෙනෙන පුතා වෙනුවෙන් හැඬුවත් මට්ටකුණ්ඩලී හඬා වැටෙන්නේ පියවි ඇසට පෙනෙන සම්පත් වෙනුවෙනි. මිනිස් සිත අන්‍යයන්ගේ වරද දැකීමට සමත් වුව ද සිය වරද දැකීමට සමත් නොවේ.

භාගිනෙය්‍ය සංඝරක්ඛිත තෙරුන්ගේ වස්තුව අනාගතය පිළිබඳ මිනිස් මනසේ ගොඩනැගෙන ජල්පනවල ස්වභාවය ප්‍රකට කරන්නකි. සිය මාමා වූ තෙරුන් තමන්ට අකමැති නිසා සිවුරු හැර ගොස් ගත කරන ජීවිතය ගැන භාගිනෙය්‍ය සංඝරක්ඛිත තෙරණුවෝ නිහඬවම සිතූහ. ජීවිකාව ගත කිරීම පිණිස මේ අටරියන් වස්ත්‍රය විකුණා එළදෙනක් ද ඇගේ පැටවුන් විකුණා ධනය ද පසුව බිරිඳක් ද ලබා ගැනීමට ගුරුවරයාට පවන් සලමින් ම උන්වහන්සේ සිතූහ. පසුව තෙරුන් වහන්සේ දකින්නට දරුවා ද සමඟ එන කල බිරිඳගේ නොසැලකිල්ලෙන් දරුවා රියෙන් බිමට වැටුණොත් කෙවිටෙන් ඇයට තලන්නෙමියි සිතා වටාපතින් සිය ගුරුවරයාට පහර දීම මිනිස් මනසේ ජල්පනයේ ස්වභාවය මොනවට පැහැදිලි කරන්නකි. මනෝලෝකයක තනි වූවන්ට පියවි ලෝකයේ සිදුවන්නේ කුමක්දැයි නොදැනේ.

චිත්තහත්ථ තෙරුහු සත් වරක් මහණව හයවරක් ම උපැවිදි වූ අතර සත්වන වර රහත් ඵලයට පත් වූහ. උන්වහන්සේ පැවිදි වූ විට ගිහි බව හොඳ යැයි සිතා සිවුර හළ අතර ගිහි වූ විට පැවිද්ද මැනවැයි කල්පනා කළහ. පවත්නා තත්ත්වය අතෘප්තිකර බව ද ඉදිරියෙහි හෝ වෙනයම් තැනක තෘප්තිය ඇතැයි සිතීම මිනිස් සිතේ ස්වභාවය යි. බොහෝ විට ළඟ ඇති දැට වඩා වටින්නේ ඈත ඇති සම්පතයි. කුඩා කාලයේ සිට ස්ත්‍රීන් ප්‍රතික්ෂේප කළ අනිත්ථිගන්ධ කුමාරයා අවසානයේ සියලු පිරිමින් පොලු ගසන්නට වූයේ ද ස්ත්‍රියක නිසාවෙනි.

සොරෙකුට පෙම්බැඳි කුණ්ඩලකේසියගේ ප්‍රවෘත්තිය රාගික හැඟීම් සන්තර්පනය සඳහා හිත බැඳී ගිය කල්හි සමාජ සම්මත නොසලකන බව සනාථ කෙරේ. පටාචාරා ප්‍රේමයේ නාමයෙන් වැඩකාරයා තමන්ගේ ප්‍රේමවන්තයා ලෙස තෝරා ගත්තාය. පටාචාරා ඇය තුළ ඇති වූ ප්‍රේමය හෝ රාගය ආත්මාර්ථය යට කොට නැගුණක් නොවේ. එය එසේ විය යුතු යැයි අදහසක් නැත. පුහුදුන් සත්ත්වයා වැඩිපුරම ආදරය කරන්නේ තමන්ටම බව සනාථ කරමින් කුණ්ඩලකේසී විසින් සිය සැමියා සොරපව්වෙන් හෙළා මරා දමන ලද ආකාරය කුණ්ඩලකේසී වස්තුවෙහි දක්නට ලැබේ. ස්ත්‍රිය සතු සියුම් බුද්ධිය ඉන් පෙනේ. ජඩත්වයට පත් මනස කෙතරම් උසස් තත්ත්වයට පත් වුව ද සම්පත් ලැබුණ ද ඉන් නොමිදේ. සොරා සියලු සම්පත් ලැබ තිබිය දී සොරකමට පෙළඹෙන්නේ එලෙස ඇති කර ගත් පුරුද්ද නිසා ය.

මච්ඡරියකෝසිය කෘශව සුදුමැලිව මිලාන වී ගියේ කැවුමක් කෑම පිළිබඳ ආශාවකිනි. එදිනෙදා දිවි ගැට ගහගන්නා මිනිසාට ද පහසුවෙන් සඵල කර ගත හැකි අරමුණක් කෝටිපතියෙකුට ඉටු කර ගැනීමට නොහැකි වන්නේ මිනිස් මනසේ පැළපදියම් වී ඇති තෘෂ්ණා ජාලය ඔහුගේ සමස්ත අධ්‍යාත්මය වෙළාගෙන ඇති බැවිනි. කුම්භඝෝසක සිටුපදවිය ලබන්නේ ඔහු සතු වූ ගැඹුරු දුරදක්නා නුවණ නිසා ය. ස්ත්‍රී චරිතයෙහි රූප මදය සුවිශේෂ මානසික ධර්මයකි. රූපනන්දා බුදුරදුන් හමුවට නොයන්නේ රූප මදයෙන් මත් ව අහංකාරයෙන් පිරුණු එකියක නිසා බව එම වස්තුවෙහි දැක්වේ. කුල මානයෙන් හා ඥාති මදයෙන් මත් වූ ථුල්ලතිස්ස තෙර කෙස් රවුළ බා සිවුරු පොරවා ගෙන මහතෙර කෙනෙකුන් ලෙස පෙනී සිටියෙකි. සොර මහණෙකු ලෙස පුදසත්කාර ලැබූවෙකි. බහුභාණ්ඩික තෙර සඟවා ගෙන සිටි

තමන්ගේ ආධ්‍යාත්මයේ ඇති බොල් බව සහ අකීකරු බව ප්‍රකට කරමින් බුදුරදුන් ඉදිරියේ සිවුර ගලවා විසි කොට අඳනය පමණක් හැඳ සිටියේය.

ස්ත්‍රී මායමෙහි පුහුදුන් සියලු පිරිමි රැවටෙන බව පැවසේ. මුගලන් තෙරුන් විසින් පෙර භවයක සිය දෙමාපියන්ට තළා පෙළා පීඩාකරන ලද්දේ සිය බිරිඳගේ වදන් පිළිගැනීමෙනි. උක්ත බන්ධනය හා ස්ත්‍රී මායම් තිරිසන් සමාජයෙහි ද දක්නට ලැබෙන බවට නන්ද වස්තුවේ අතීත කථාව සාක්ෂ්‍ය දරයි. චක්ඛුපාල තෙරුන් අතීත කථාවේ වෛද්‍යවරයෙකි. තමන් බේත් ගැල්වීමෙන් අනතුරුව රෝගී කාන්තාව සුවපත් වුව ද ඇය පොරොන්දුව ඉටු නොකරයි. ඉන් ද්වේෂයට පත්වන වෛද්‍යවරයා විෂ බේතක් ගැල්වූවාය. ඇ සදාකාලිකවම අන්ධ වූවාය.

## රස උත්පාදනය

එපමණක් ද නොව විවිධ රස උත්පාදනයට ද කතුවරයා සුවිශේෂ කුසලතාවක් දක්වයි. සද්ධර්මරත්නාවලියේ මුඛ්‍ය රසය කරුණා රසය යැයි කිවහොත් නිවැරදිය. කතුවරයා ගැමියෙකු ලෙස ලද උසස් අවබෝධය කවියෙකු ලෙස සහෘද රස වින්දනයට තිළිණ කළේය. "ග්‍රන්ථ ඥානයෙන් ම නොව ජීවනයෙහි දුකසැප දකීමෙන් ඇසීමෙන් හා වටහා ගැන්මෙන් ලත් පැසුණු බුද්ධිය ඇති උන්වහන්සේ තුළ කෙලෙස් පීඩනයෙන් පීඩිතයන් නිසා හටගත්තේ කෝපය නොව දයානුකම්පාව ය. කවිත්වයට වැඩි උපාසකකම් ඇති අනික් ඇතැම් ග්‍රන්ථකාරයෙක් කෙලෙස් පීඩනයෙන් පරිපීඩිතයන්ට බැණ වැදුණේය. ද්වේෂ කළේය" (වික්‍රමසිංහ, 1956: 142, 143 පිටු). පටාචාරා නම් රූමත් කුමරිය වැඩකාරයා සමග ප්‍රේමයෙන් බැඳෙන්නේ සමාජ සම්මතයන් දෙදරවමිනි. එහෙත් ඇය කෙරෙහි ද්වේෂයක් සහෘදයාගෙන් මතු නොවීමට කතුවරයා නිර්මාණශීලී වේ.

පටාචාරාගේ සැමියා අකාලයේ මිය ගිය ආකාරය සහෘදයාගේ හද කම්පා කරවන සුලු ය. ප්‍රසව වේදනාවෙන් දරුවා බිහි කිරීම සහෘදයාගේ කරුණාව පටාචාරා වෙත යොමු කිරීමෙහි ලා සමත්වෙයි. "මෙසේ එක් ව යන කලට නොකල් නොවේලා කොටලා මහ වැස්සෙක් නැගීය. ඒ වේලාව ගසන විදුලියෙන් හා මේඝ නාදයෙන් හා වස්නා වැස්සෙන් අවකාශය අතුරු සිදුරු නැති විය. ඒ වේලාවට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විලිත් පහරනට වන. ආස ගුගුරන්නා සේ හඬ ගසන්ටත් වන. වස්නා වැසි බෝ වා සේ ම ප්‍රසව දුකුත් බෝවිය... නොතෙමී වදා පියන තැනත් ඉදිකරවයි කිවුය..." (සද්ධර්මරත්නාවලිය, 1985: 443 පිට). පටාචාරා කලින් කළ වරද අමතක ව ගොස් ඇය පිළිබඳ වැඩි අනුකම්පාවක් ඇති කරවීමට කතුවරයා සමත් වෙයි. ක්‍රමානුකූලව සහෘදයා සිය අභිමතාර්ථය වෙත කැඳවාගෙන යන අයුරු අපූරු ය.

සිව් මසක් පාඩම් කළ ද එක ගාථාවක් පාඩම් කර ගත නොහැකි වූ චුල්ලපන්ථක පොඩි හාමුදුරුවන්ට ශාසනයෙන් බැහැර වන ලෙස තමන්ගේ ම අයියා වන මහාපන්ථක තෙරණුවෝ නියම කළහ. බුදුන් වහන්සේ මහාකරුණා සමවතින් ලොව බලන වේලාවෙහි උපැවිදි වීමට අකමැති චුල්ලපන්ථක මහාපන්ථක

තෙරණුවන්ගේ නියෝගයෙන් සිවුරු හරනට සූදානම් වන බව දුටහ. උන් වහන්සේ පෙරමඟ පෙනෙන සේ සක්මන් කළහ. චුල්ලපන්ථක තෙරණුවෝ බුදුන් වහන්සේ දැක එහි ගොස් නමස්කාර කළහ. පිණ්ඩපාතයටවත් වේලා නැතිව මේ රෑ ඔබ යන්නේ කොහිදැයි බුදුරදුහු ප්‍රශ්න කළහ. එවිට චුල්ලපන්ථක තෙරුන් හා බුදුරදුන් අතර සිදුවුණ සංවාදය කරුණා රසයෙන් පිරුණකි. ''ස්වාමීනි අපගේ බෑණනුවන්වහන්සේ ශාසනයෙන් නෙරනා හෙයින් සිවුරු හරනට නික්මුණු නියා යයි වදාළ සේක. ඒ අසා හැයි චුල්ලපන්ථකයෙනි, තොපගේ මහණවීම කවුරුන් මහණ කළත් මා මුල් වුව. ශාසනයත් මාගේ බව මුත් තොපගේ බෑණන්ගේ නොවත්. උන්ගේ කීමෙන් මාගේ කීමක් නැතිව තොප යන්නේ හැයි ද? ශක්‍රසම්පත්තීන් බ්‍රහ්ම සම්පත්තීන් පිරිහෙන්නා සේ සිවුරු හැරීමෙන් ප්‍රයෝජන නැත. එක් බමුණකු තමාගේ දුව සරණ දෙන ගමනේ කෙළෙඹියන් වෙහෙසන්ට කියාලූ බස බස් කොට සිතා ගෙන අනුන් නොපැලඳි මල් පලඳවන්ට සිතා කිසි කලෙකත් නැතිව තිබෙන දිඹුල් මල් සොයා ඇවිද ආයාස ගත් කල් සේ බුදුන් නූපන් කලෙක නැතිව තිබෙන බව මුත් බුදුන් ඇති සමයේ  ඇතිව තිබෙන නිවන් නසා ගන්නා ආයාස යහපත් බැවින් උන් ළඟ රඳවන්ට බැරි වුවත් තෙපි මා ළඟ රඳව. උගන්වා ලන ක්‍රම නොදන එක ගාථාව සාර මසකින් උගන්වා ගත නුහුණුවා මම අද පෙරවරු ඇතුළත තෙවළා බුදුවදන් උගන්වා ගත නොහිණිම් නම් එද යා නොහැකි ද? තෙපි රඳවයි මොළොක් බසුත් වදාරාලා බස මොළොකට නොඅඩු ඉතා මොළකැටි අතින් උන්වහන්සේගේ හිසත් පිරිමැද...'' (සද්ධර්මරත්නාවලිය, 1985: 186, 187 පිටු).

දරුවෙකු දුක්ඛිත තත්ත්වයකට මුහුණ දුන් පසු දෙමාපියෝ තමන්ගේ ජවය බලය කියති. බුදුරජාණෝ, ශාසනය මාගේ වෙන කාගෙවත් නොවෙයි, කියද්දී චුල්ලපන්ථක තෙරුන්ට ලොකු සහනයක් දැනුනාට සැක නැත. අසරණ ව සිටින චුල්ලපන්ථක හිමියන්ට කිසිම ආකාරයක හිත රිදෙන වදනක් හෝ බුදු මුවින් නොගිලිහේ. සාර මසකින් ගාථාව පාඩම් කර ගත නොහැකි වූයේ පෙර කරන ලද අකුශල කර්මයක් නිසා බව බුදුරදුන් දැන ගත්ත ද උන්වහන්සේ ඒ මොහොතේ එය දේශනා නොකරති. ගාථාව පාඩම් කර ගත නොහැකි වූයේ චුල්ලපන්ථක හිමියන්ගේ වරදින් නොව උගැන්වූ ගුරුවරු උගැන්වීමේ ක්‍රම නොදැනීම නිසා බව ද බුදුහු පවසති. එය පීඩනයට පත් මානසිකව අවපාතයට ඇදවැටුණු චුල්ලපන්ථක හිමියන් නගාසිටුවීමට තරම් ශක්ති සම්පන්න වදනකි. අවසාන වශයෙන් බුදුරජාණෝ පෙරවරුව ඇතුළත බුදුබණ උගන්වන බව ද එසේ නොහැකි වුවහොත් යා හැකි බව ද පැවසීම කෙතරම් කාරුණික ද?

පුත්‍රස්නේහයෙන් උමතු වූ කිසාගෝතමී මළ පුතා ඇකයෙහි හොවාගෙන ඖෂධ සොයමින් යන ගමන සහෘද හද කම්පා කරවන සුලු ය. බැරෑරුම් කුෂ්ට රෝගයකින් පීඩා විඳි පූතිගත්තතිස්ස තෙර මිත්‍ර භික්ෂූන් විසින් ද අත්හැර ගිය පසු තනිවෙයි. උන්වහන්සේගේ පිහිටට බුදුරදුන් පැමිණ ගිනිහල් ගෙට ගොස් වළඳ සෝදා වතුර ලිපේ තබා උණු වන තෙක් කුස්සියේ ම ඉඳගෙන සිටීම බුදුරදුන්ගේ මහා කරුණා ගුණය සහෘදයාගේ හද කාවදී. උණු වන ළයමඬල ඇත්තෝ හදින් කඳුලු වගුරවති යි කතුවරයා දක්වයි.

අශුචි අනුභවයෙන් ජීවිතය ගෙවූ ජම්බුකාජීවිකයා පිළිබඳ ජම්බුකාජීවක වස්තුව පුරා බීබත්ස රසය පිරී තිබේ. පූතිගත්තතිස්ස තෙරුන්ගේ සිරුරෙහි කුෂ්ට සෑදුණු අයුරු කරන විස්තරය ද පිළිකුල දනවන සුලුය. උපහාසය දනවීමෙහි ලා කතුවරයාට වූ සහජ කුසලතාව ග්‍රන්ථය පුරාම දක්නා ලැබේ. මට්ටකුණ්ඩලී නම් තම පුත්‍රයාට කුණ්ඩලාභරණ තනවා දෙන්නට ගිය අදින්නපුබ්බක ඒ සඳහා යන වැඩ කුලී ආදිය ගැන හිතයි. පසුව තෙමේ ම එය තලා සකස් කොට දුන්නේය. "තුමූම රත්රන් හැරගෙන අකුරු ලියන සේ නොදන්නා කෙනෙකුන් පත්වල හිරි අඳනා සේ කුණ්ඩලාභරණයෝ තළා පියා දුන්හ". (සද්ධර්මරත්නාවලිය, 1985ඃ 41 පිට) යන පාඨය අදින්නපුබ්බකගේ මසුරුකම මැනවින් උපහාසයට ලක් කෙරේ. අදින්නපුබ්බක පුතා පාණ්ඩු රෝගයෙන් පෙළෙද්දී ඊට සුදුසු වෙදෙකු නොගෙන්වා තැන තැන ඇවිද ගොඩවෙදකම් කළේය. කතුවරයා සතු වූ සහජ උපමා කුශලතාව ද යොදා එම ක්‍රියාව උපහාසයට ලක් කරන්නේ "පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ ඇස් සරහන්ට තොල අඳුන් ගානා සේ..." (සද්ධර්මරත්නාවලිය, 1985ඃ 41, 42 පිටු) යනාදි ලෙස ය.

දෙව්රම්වෙහෙර කුටියක උස් පුටුවක සිට වැඩිමහලු බව අඟවා හොරට වැඳුම් පිදුම් ලැබූ ථුල්ලතිස්සට (මහත තිස්ස) භික්ෂූහු දොස් නගති. ඉන් කිපුණු තිස්ස හිමි ''මම තමන් හැම දෙනාගේ බුදුන්ට අවශ්‍යයෙමි. තමන් හැමගේත් අවශ්‍ය කමෙක් ඇද්ද? තමන්ගේ බුදුන්ගේ පිය රජ්ජුරුවෝත් අපගේ මෑණියෝත් දෙබිත්තය. අපගේ තරම් නොදන තමන් හැම අපට දෙඩූ සැටියට බුදුන්ගේ නෑකම් සැබෑ වීනම් අද කියමි. බුදුන් කුමක් වදාරණ බවත් නොදනම නියං සමයේ හඬන ආසක් මෙන් ගර්ජනා කොට ගෙන හඬමින් වලපමින් බුදුන් කරා ගිය සේක...'' (සද්ධර්මරත්නාවලිය 1985ඃ 70 පිට). මේ පාඨය කියවන්නා හෝ අසන්නා තුළ චිත්තරූප මැවෙනුයේ නිරායාසයෙනි. ඥාතිවාදයෙන් හිස උදුම්මා ගත් තිස්සගේ පුරසාරම් කථාව උපහාසය ගෙන එයි. ''නියං සමයේ හඬනා ආසක් මෙන්'' යැයි උපමා කිරීමෙන් සමස්තයේ අර්ථය තීව්‍ර වෙයි. ශබ්දය තිබුණ ද තිස්ස හිමියන්ගේ උත්සාහය ඵල නොදරන්නාක් බව එම උපමාවෙන් සහෘදයා තේරුම් ගනී.

වස්ත්‍රයෙන් බැබලීම ඇති කර ගත්තත් අභ්‍යන්තරයේ ඇති පහත් හැසිරීම් ක්‍රමයෙන් එළියට එන බව කසාවපරිදහන වස්තුවේ උපහාසයෙන් දක්වා තිබේ. (සද්ධර්මරත්නාවලිය, 1985ඃ 95 පිට) හත් වරක් මහණව හය වරක් සිවුරු හළ චිත්තහත්ථ තෙරුන්ගේ කථාව සපුරා උපහාසයෙන් පිරුණකි. සයවන වර සිවුරු හැර පැමිණි චිත්තහත්ථගේ බිරිය වී කොටා වෙහෙස වී වස්ත්‍රය ද නොසලකා නිදා ගත්තාය. ඇගේ නිදන විලාශය දුටවොත් නැවත චිත්තහත්ථයන් මහණ වෙතියි සිතූ මව ඇයට ඒ ගැන පැවසූ බස් හා ඈ ඊට දුන් පිළිතුරු උපහාස රසයෙන් පෝෂ්‍යය. ''කුඹුරේ සිට දැන්ම අවුත් ගෙයි මඳකුත් රඳා නොපියා හිණකඩ එකතින් ගෙන වෙහෙර බලා යෙති. කුමක් දෝ හෝයි දුවණියන් වැදහොත් ගෙට ගොසින් නිදන දුවණියන් දකලා මෑ වැද හෙව අසඤ්ඤතව නිදන ලෙස බලා කලකිරී යන වනැයි සිතා ගෙන දුවණියන් ගසා පුබුද්දා පියා කාලකණ්ණිය නැගී සිට. තී සාමි අවුත්

තී වැදහොත් ලෙස බලා කලකිරී ගියේය. මෙවක් පටන් තිට ඒ තැනැත්තේ වේද යි කිවූ,ය. ඕ ඒ අසා ආදි සේම දෝ හෝයි සිතා අම්ම මුඹ නොදොඩන්නේ උන්ට ගමනෙක් කොයින් ද? ගියත් කිහිප දවසකින් එති උන්ගේ අදහස මට දැනෙන්නේ වේ දැයි කිවූය.'' (සද්ධර්මරත්නාවලිය, 1985: 96 පිට)

කිරි රොටී (කබලු පුව) අනුභවයෙහි රස තෘෂ්ණාවක් ඇතිවුණු මච්ඡරීයකෝසිය සිටුවරයා අසූ කෙළක් ධනය ඇත්තෙකි. අධික තෘෂ්ණා හැඟීම නිසා ම සිය අපේක්ෂාව සඟවා ගෙන සිතින් වේදනා වින්දේය. අවසානයේ සිය බිරියට කියා කිරි රොටී කෑමේ අපේක්ෂාව ඉටු කර ගත්තේ කෙතරම් අපහසුවෙන් ද? ''මේ සිටුවරයා තණ අග ගාලා තෙල් බින්දුවක් විතරක් අනුන්ට දීලත් නම් සිතට දුක් බලවත් හෙයිනුත්... උන් ලද සම්පත නම් රකුස්සන් තමන් නොබොන හෙයිනුත් අනුන් බිය නොදෙන හෙයිනුත් රකුසු රකවල තුබූ විලක් වැන්න.'' (සද්ධර්මරත්නාවලිය, 1985: 259 පිට) සිටුවරයා තණ්හාවේ දාසයෙකු බව ප්‍රකට කිරීමට ඉහත උද්ධෘතය සමත් වෙයි. සමස්තයක් ලෙස කතුවරයා දක්වන උපහාස රසය දයානුකම්පිත එකක් බව පැවසිය යුතුය.

## සද්ධර්මරත්නාවලී සමාජය

මීළඟට සද්ධර්මරත්නාවලියෙන් හෙළි වන සමාජ තොරතුරු පිළිබඳව ද කෙටියෙන් නමුත් සාකච්ඡා කළ යුතුය. සද්ධර්මරත්නාවලිය ධම්මපදට්ඨකථාවේ අනුවාදයක් බැවින් ලංකාවේ සමාජ තොරතුරු එහි ගැබ් ව ඇති ද යන සැකය සහෘදයා තුළ නිසැකව ම හට ගනී. එහෙත් සද්ධර්මරත්නාවලිය ආශ්‍රයෙන් මධ්‍යකාලීන ලංකා සමාජය ගැන පර්යේෂණාත්මක නිබන්ධයක් ආචාර්ය එම්.බී. ආරියපාල කළේය. සම්ප්‍රදායික පිළිගැනීම අනුව මිහිඳු මහරහතන් වහන්සේ විසින් ථෙරීය අටුවා ලංකාවට ගෙනෙන ලදහ. කාලයාගේ ඇවෑමෙන් එම පාලි අටුවා සිංහලට නගන ලද අතර පාලි අටුවා අභාවයට ගියේය. බුද්ධඝෝෂ මහරහතන් වහන්සේ ප්‍රමුඛ යතිවරු නැවත සිංහලෙන් තිබූ හෙළටුවා පාලියට නැගූහ. එලෙස නගන ලද ධම්මපදට්ඨකථාව ආශ්‍රයෙන් සද්ධර්මරත්නාවලිය බිහි විය. ඒ ඒ අවස්ථාවල දී කාලීන අවශ්‍යතා අනුව පාලියට හා සිංහලට නැගුණු මෙම අටුවාවෙහි ලංකාවේ හා ඉන්දියාවේ සාමාජික තොරතුරු රැසක් ඇතුළත්ය. තවද ලංකාව ඉන්දියාව සමීපයේ ම පිහිටා ඇති නිසා එහි සාමාජික ජීවිතයේ බලපෑම බහුල වශයෙන් ලංකාවට ද ලංකාවේ සාමාජික ජීවිතයේ බලපෑම අවම වශයෙන් හෝ ඉන්දියාවට ද ලැබෙන්නට ඇතැයි සිතිය හැකිය. සාමාජික තොරතුරු පරීක්ෂණයෙහි සද්ධර්මරත්නාවලියේ ඇති වටිනාකම මාර්ටින් වික්‍රමසිංහයන්ගේ පහත සඳහන් ප්‍රකාශනයෙන් සනාථ වේ. සද්ධර්මරත්නාවලිය ලියන කාලයෙහි ලක්දිව පැවති සිරිත් විරිත් ද මිනිසුන්ගේ සිතුම් පැතුම් හැඬුම් දෙඩුම් ආශ්‍රයෙන් ගැළපූ උපමේයයෝ වර්ණනයෝ ද එහි පිටක් පාසා දක්නා ලැබෙති. පැරණි සිංහලයන්ගේ සමාජ තත්ත්වය සෙවීමට මෙතරම් උපකාර වන අනෙක් සිංහල පොතක් නැත්තේය. (වික්‍රමසිංහ, 1993: 40 පිට) සමාජයක් යනු විවිධ වෘත්තීන්හි නියැළෙන මිනිසුන්ගෙන් යුත් ඒකකයකි. සද්ධර්මරත්නාවලියේ සමාජය මහත් සේ පළල්ය. පැවිද්දන් හා ගිහියන්, රජවරුන් හා වෙනත් රාජකීයයන්, සාමාන්‍ය කෙළඹි පුත්‍රයන්, ගොවියන්, වඩුවන්, වැද්දන්, කුඹලුන්, මල්කරුවන්,

වෙළඳුන්, සොරුන්, මාලු මරන්නන්, මෙහෙකරුවන්, කතුවරයාගේ ග්‍රන්ථ සමාජයට අයත් ය.

සාමාජික ජීවිතයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ගොවිතැන වුව ද ඉහත දැක්වූ අනෙකුත් කර්මාන්තවල නියැළුණේ ද වූහ. එකල සමාජයේ බහුභාර්යා සේවනය පවතින්නට ඇතැයි අනුමාන කළ හැකි පුවතක් මහාකාල තෙරුන් වහන්සේගේ වස්තුව කියාපායි. සොරකම් පිළිබඳ නිරන්තරයෙන් තොරතුරු මෙහි දක්නට ලැබෙන අතර, ඒ සඳහා මරණීය දණ්ඩනය, දිවස් හුල තැබීම, නඩු විසඳීමෙන් පසු දඬුවම් ලෙස අනුමත විය. සොරාගේ අත් පිටිකර හයා බැඳ කසවලින් පහර දෙමින් පෝරක වෙත ගෙනයාම ද සිදු විය. පොදුවේ දඬුවම් ලෙස ඉන්දියාවේ එකල පැවති දඩ ගැසීම, දඟගෙයි ලෑම, අත්පා කැපීම, රටින් නෙරපීම හා මරණ දඬුවම මෙහි ද ක්‍රියාත්මක විය. විටෙක දෙන දඬුවම අපරාධයට වඩා බරපතල බව පෙනේ. (ආරියපාල, 1962: 107, 108 පිටු)

ඉන්දීය සිරිත අනුව රජතුමාට උපදෙස් දීම සඳහා පුරෝහිතයකු පත්වූ බවට ද සද්ධර්මරත්නාවලිය සාක්ෂ්‍ය දරයි. එහෙත් හැම විටම ඒ සඳහා බ්‍රාහ්මණයකු තෝරා ගන්නා ලද දැයි කිව නොහැකි බව ආචාර්ය ආරියපාල පවසයි. (ආරියපාල, 1962: 76 පිට) විවාහය සඳහා සුදුසු වයසට පැමිණි පසු දෙමාපියෝ සුදුසු තැනකින් විවාහයක් කරවා දුන්හ. එහි දී ජාති, ගෝත්‍ර සැලකිල්ලට ගන්නා ලද බව විසාඛා වස්තුවෙන් පෙනේ. දෙමාපිය කැමැත්ත අනුව මංගල යෝජනා මගින් සරණයෑම සාමාන්‍ය ක්‍රමය වුව ද ප්‍රේම සම්බන්ධතා මත විවාහය සිදු විය. පටාචාරා, ස්වර්ණතිලකා, කාඤ්චනාදේවී කථා වස්තු උක්ත කරුණ සනාථ කරයි. කුලය, ගෝත්‍රය සොයා බැලීම සාමාන්‍ය සිරිත වුව ද ප්‍රේම සබඳතා මත එය උල්ලංඝනය කරමින් සාලිය කුමාරයා අශෝකමාලා සමග විවාහ වීමෙන් ප්‍රකට වේ. (ආරියපාල, 1962: 288 පි.) ''පුරුෂයෙකු තෝරා ගැනීම කුලය, පොහොසත්කම, තත්ත්වය හා අධ්‍යාපනය යන ප්‍රධාන කරුණු උඩ කෙරුණ බවත් ස්ත්‍රියක ගැන බලන කල ගෙදරදොර කටයුතු කර ගැනීමට පුළුවන්කම අවශ්‍ය වූ බවත් දැන් අපට නිගමනය කළ හැක.'' (ආරියපාල, 1962: 288 පිට) විවාහයෙන් පසු එම යුවළ මහගෙදරින් වෙන්ව වෙන ම ජීවිතයක් ආරම්භ කිරීම සිදු විය. විශේෂයෙන් ඇවැස්ස විවාහයට විශේෂ තැනක් එකල වූ බව සද්ධර්මරත්නාවලියෙන් පෙනේ යැයි ආචාර්ය ආරියපාල පවසයි. (ආරියපාල, 1962: 290 පිට)

ස්ත්‍රිය පිළිබඳ කතුවරයා දක්වන්නේ ශුභවාදී ආකල්පයක් නොවේ යැයි හැඟේ. ඇය නිරන්තරයෙන් අවස්ථාව ලද හොත් වරදෙහි බැඳෙන චපල එකියක සේ හඳුන්වයි. ''ගෑනු නම් අනර්ථකාරී හෙයින් ගස්වල වළඳිනා ලීය ගසට නොසිතා තමාට පිහිට නිසා වළඳිනා සේ කවුරුන් වුවත් භාජනය කෙරෙති'' යන පාඨයෙන් සනාථ වේ.

කෙනෙකු මිය ගිය විට භාවිත කෙරෙන මිනීපෙට්ටිය පැරණි සිංහල සමාජයේ නොතිබුණු බවත් ආදාහනය කිරීම සාමාන්‍ය සිරිත වූ බවත් පෙනේ. දුප්පතුන් දර

සෑයක් තනවා ගැනීමට හැකියාව නැති බැවින් දර ගොඩක් ගසා ආදාහනය කළ බව මහාකාල කථා වස්තුව ඇසුරෙන් ආචාර්ය ආරියපාල පෙන්වා දෙයි. (ආරියපාල, 302 පි.) මෙකල ගැමියෝ වෘක්ෂ දේවතා පූජනයෙහි යෙදී සිටි බව චක්ඛුපාල තෙරුන්ගේ වස්තුවෙන් පෙනේ. චක්ඛුපාල හිමියන්ගේ පියා සිය බිරිඳට දරු සම්පත් ලැබීම සඳහා මහාරුකකට භාර විය. සොහොනෙහි වාසය කරන විට ඒ හා බැඳුණු සිරිත් විරිත් පිළිබඳ විශ්වාසයක් වූ බවට මහාකාල කථා වස්තුව සාක්ෂි දරයි. කෝවිල්, යාග, බලි, යක්ෂාවේශය ගැන සද්ධර්මරත්නාවලියේ එන බැවින් ඒ පිළිබඳ යම් විශ්වාසයක් පවතින්නට ඇතැයි සිතේ. (ආරියපාල, 180 පිට)

## භාෂා භාවිතය

ග්‍රන්ථයේ භාවිත භාෂාව ගැන ඉහත සද්ධර්මරත්නාවලිය පරිවර්තනයක් ද අනුවාදයක් ද යන්න යටතේ කරුණු කිහිපයක් සාකච්ඡා කෙරිණි. ආනන්ද කුලසූරිය කතුවරයාගේ බසෙහි මුඛ්‍ය ලක්ෂණ තුනක් දක්වයි.

1. සිංහලයෙහි සම්මත ව්‍යාකරණ රීත්‍යනුකූලව බස හැසිරවීම හා විටෙක එම සම්මතයන්ට වෙනස්ව යෑම
2. වාක්‍යයන්හි උපකාරක හෙවත් හවුල් පද යෙදීම
3. ලිඛිත භාෂාවෙහි මනා වූ අමුතු පද යෙදීම (කුලසූරිය, 1963: 102 පිට)

හුරුපැටියා යන්නෙහි ස්ත්‍රී ලිංග රූපයට හීරිපැටියා යැයි යෙදීම, දියණියෝ යන ගෞරවාර්ථ ප්‍රත්‍ය සහිත යෙදුම දුවණිය යැයි යෙදීම පළමු කරුණට නිදර්ශන වන අතර 'බුදුන්ට ආරාධනා කොට ලා, මඟුලෙන් හෙලා ලූ කප, ලාභ සත්කාර නැතිව පියා' ආදි ස්ථානවල යෙදෙන ලා, ලූ, පියා, පූ වැනි උපකාරක පද යෙදීම දෙවැන්නට නිදර්ශනයි. 'උං මුසුප්පුව පිළියම් ආලෙස්සම් ව ගිනිතී සිතා, රඹගම් නුවර ඇත්තවුන්' වැනි නිදර්ශන තුන්වන කරුණ සනාථ කරයි.

කතුවරයාගේ බස ගැන අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ සංස්කෘත හා පාලි කාව්‍යයන්ගෙන් පෝෂණය ලත් අනෙක් සිංහල ග්‍රන්ථකාරයන් සිය රටත් සිය රට ජනයාත් සිය රටියන්ගේ ජන්ම උරුමයත් නොතකා නිපද වූ ව්‍යාජ ශිෂ්ට සම්ප්‍රදායට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමක් වශයෙන් ධර්මසේන ස්ථවිරයන් වහන්සේ ගම්බද ජනයාගේ ජීවනය ද බස ද ප්‍රස්තාව පිරුළු ද අභිරුචියෙන් ගෙන තමන්ගේ රචනා විලාසය හා භාෂා විලාසය නිපද වූහයි සිතිය හැකි ලකුණු සද්ධර්මරත්නාවලියෙහි දක්නා ලැබෙන බව කියයි. (විචාර ලිපි, 18 පිට) එම ප්‍රකාශනයෙන් ම ග්‍රන්ථයේ භාෂාව ගැමි ජීවිතය හා බස සමඟ බැඳුණක් බව ප්‍රකට වේ. තවද පූජාවලිය, බුත්සරණ භාවිත කළ ධර්ම දේශකයන්ගේ භාෂාව කතා කීමට උචිත බසක් ලෙස සංස්කරණය කරන ලද්දේ ධර්මසේන හිමියන් විසිනි. (කුලසූරිය, 1963: 139 පිට) මේ භාවිත භාෂාව දඹදෙණි යුගයේ භාවිත කථන භාෂාව, නුවූවත් ඊට බෙහෙවින් සමාන බසකි. එසේ ම පූර්වක්‍රියාවලින් සම්බන්ධ කෙරී ඉදිරියට ගලා යන දීර්ඝ වාක්‍යවලින් යුත් භාෂාව සේ ම කෙටි වැකි සහිත භාෂාව ද ග්‍රන්ථයේ දක්නට ලැබේ.

කතුවරයා විටෙක සංවාදශීලී භාෂාවක් අනුගමනය කරයි. ශක්‍රයා හා පාලිත තෙරුන් අතර කෙරෙන ''මම ය ස්වාමීනි, මගී එකෙකිමී කී කල්හි උපාසකයෙනි කොයි යවුදැයි විචාළ සේක. සැවැත් නුවර යෙමි යි කී කල්හි ඉක්මන්ව යන කෙනෙක් නම් උන්ට කල් යන්නේ වේ දැයි සිතා එසේ කල යවයි වදාළ සේක. මම වන්නා යන්නෙම් වේ දැයි ස්වාමීනි වඩනේ කොයි දැයි විචාළෝය. අපිත් සැවැත් නුවරට යම්හයි වදාළ සේක. එසේ වී නම් කැටිව යම්හයි කිවුය.'' (සද්ධර්මරත්නාවලිය, 1985: 37 පිට) කුල මානයෙන් ඔදවැඩී බුදුරදුන් වෙත අඬමින් ගිය ථුල්ලතිස්ස තෙරණුවන් හා බුදුරදුන් අතර වන සංවාදය සිත්ගන්නා සුලුය. (සද්ධර්මරත්නාවලිය 1985: 70 පිට) එසේ ම කතුවරයා විසින් සිය බස උපමා රූපක වැනි අර්ථාලංකාරවලින් ද අනුප්‍රාස වැනි ශබ්දාලංකාරවලින් ද සරසන ලද ආකාරය ඉහත සාකච්ඡා කෙරිණි. තව ද එතුමා උපමා සමග ම ගැමි පිරුළු යෙදීමෙන් බසෙහි නව ප්‍රාණවත් බවක් උපදවා තිබේ.

## නිගමනය

පැරණි සම්භාව්‍ය සිංහල ගද්‍යයේ අරමුණ වූයේ සාහිත්‍යාත්මක ගුණය කැටිකොට ධර්මයේ පණිවුඩය වඩාත් සිත්ගන්නා ලෙස සහෘදයා වෙත රැගෙන යැමයි. උක්ත ධර්ම සන්නිවේදන ක්‍රියාවලිය පාලි ග්‍රන්ථයන්ගේ පරිවර්තන හෝ අනුවාද සේ බොහෝදුරට සැලකිය හැකිය. එසේ වුවත් සද්ධර්මරත්නාවලිය එම සීමාව අතික්‍රමණය කර ඇති බව ග්‍රන්ථ පරිශීලනයෙන් සහ සද්ධර්මරත්නාවලිය පිළිබඳ කරන ලද විවිධ විද්වතුන්ගේ පර්යේෂණවලින් අනාවරණය වේ. කතුවරයා හුදු නොපැසුණු සාහිත්‍ය ආස්වාදයකට වඩා සහිත්‍යයේ ගැඹුරු ආස්වාදය වන ආනන්දයේ සිට ප්‍රඥාවට සහෘදයා රැගෙන යැමට උත්සාහ කරයි. එබැවින් කතුවරයා සිය සාහිත්‍යාත්මක සක්‍යතාව ධර්මසන්නිවේදනයට මොනවට උපයෝගී කරගෙන තිබේ. උපමාදී අලංකාර පූර්ණ කමනීය භාෂාවක් යොදාගනිමින් සදාචාරාත්මක අගය සහ මනෝවිශ්ලේෂණය ඉස්මතු කෙරෙන සද්ධර්මරත්නාවලිය උසස් සාහිත්‍ය නිර්මාණයක් ලෙස මෙන්ම සාහිත්‍යාත්මක ධර්මසන්නිවේදනයේ සුසමාදර්ශයක් සේ සැලකිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

01. අංගුත්තරනිකාය 1, (1960) *බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා*, ලංකා ආණ්ඩුවේ ප්‍රකාශනය.

02. ආරියපාල, එම්. බී. (1962) *මධ්‍යකාලීන ලංකා සමාජය*, කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

03. *සද්ධර්මරත්නාවලිය 1, 2* (1985, 1986) ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රකාශනය.

04. *ධම්මපදට්ඨකථා 1, 2* (1919, 1922) කහවේ රතනසාර හිමි සංස්කරණය, කොළඹ: සයිමන් හේවාවිතාරණ ප්‍රකාශනය.

05. කුලසූරිය ආනන්ද (1963) *සිංහල සාහිත්‍යය 2*, මහරගම: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.

06. වික්‍රමසිංහ මාර්ටින් (1956) *සිංහල සාහිත්‍යයේ නැගීම*, කොළඹ: මවුන්ට් යන්ත්‍රාලය.

07. වික්‍රමසිංහ, මාර්ටින් (1993) *පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම, දෙහිවල: සීමා සහිත තිසර ප්‍රකාශකයෝ.*

*08. සංයුත්තනිකාය 1 (1960) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා,* ලංකා ආණ්ඩුවේ ප්‍රකාශනය.